2006 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

| | *සටහන* | *2006 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රුපියල්* | *2005 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රුපියල්* |
|---|---|---|---|
| මෙහෙයුම් ආදායම | | | |
| පුනරාවර්තන ප්‍රදානය | 4 | 503,400,000.00 | 391,000,000.00 |
| ශුද්ධ ආදායම/වෙනත් කටයුතුවලින්(පාඩුව) | 5 | 11,652,977.45 | 6,961,135.89 |
| වෙනත් ආදායම | 6 | 8,078,564.81 | 7,360,000.60 |
| | | 523,131,542.26 | 405,321,136.49 |
| ශිෂ්‍යයන්ට මුල්‍යාධාර | 7 | 23,659,400.00 | 84,949,150.00 |
| | | 546,790.942.26 | 490,270,286.49 |
| මෙහෙයුම් වියදම් | 8 | | |
| පෞද්ගලික පඩිනඩි | | 397,001,167.92 | 323,889,405.83 |
| ගමන්වියදම් | | 1,528,936.62 | 2,692,716.68 |
| භාවිත කළ සැපයුම් හා පාරිභෝගික | | 21,278,243.50 | 16,566,580.83 |
| නඩත්තුව | | 5,059,260.93 | 5,824,020.89 |
| කොන්ත්‍රාත් සේවා | | 19,686,117.77 | 20,033,478.39 |
| පර්යේෂණ සහ සංවර්ධන | | 271,660.38 | 575,518.05 |
| අගය අඩු වීමේ සහ ක්ෂය වීමේ වියදම | | 136,990,696.59 | 91,872,575.78 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 7,453,364.99 | 9,672,087.79 |
| මුළු මෙහෙයුම් වියදම් | | 589,269,448.70 | 471,126,384.24 |
| මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/(ඌනතාව) | 9 | (42,478,506.44) | 19,143,902.25 |

| | සටහන | 2006 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රුපියල් | 2005 දෙසැ. 31න් අවසන් වූ වර්ෂය රුපියල් |
|---|---|---|---|
| ශිෂ්‍යයන්ට මූල්‍යාධාර | | 23,659,400.00 | 84,949,150.00 |
| මුළු කටයුතුවලින් අතිරික්තය/(ඌනතාව) | | (66,137,906.44) | (65,805,247.75) |
| අතිවිශේෂ අයිතම (කපාහැරීම් සහ වෙනත් ගැලපීම්) | | 296,821.70 | 586,537.10 |
| අදාළ කාලය සඳහා අතිරික්තය/(ඌනතාව) | | (66,434,728.14) | (66,391,784.85) |

පොදු සංචිතය මාරු කළා

නිවැරදි බවට සහතික කරනු ලැබේ.

මහාචාර්ය ආර්. කුමාරවඩිවේල්,
ගණක නිලධාරි,
උපකුලපති.

කේ. කනගරත්නම්,
මූල්‍යාධිකාරී.

## යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

2006 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2006 දෙසැ. 31 දිනට රුපියල් | රුපියල් | 2005 දෙසැ. 31 දිනට රුපියල් | රුපියල් |
|---|---|---|---|---|---|
| වත්කම් | | | | | |
| ප්‍රවර්තන නොවන වත්කම් | | | | | |
| දේපළ, පිරියත් සහ උපකරණ | 10 | 557,802,573.58 | | 466,197,156.79 | |
| ආයෝජන දී. කා | 11 | 121,515,039.51 | | 116,654,487.82 | |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 12 | 203,989,221.53 | 883,306,834.62 | 200,470,031.30 | 783,321,675,91 |
| ප්‍රවර්තන වත්කම් | | | | | |
| ඉන්වෙන්ටරි/තොග | 13 | 5,558,423.85 | | 5,734,621.78 | |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු | 14 | 306,402,508.84 | | 310,932,026.52 | |
| ආයෝජන (කෙ.කා) | 15 | 5,115,261.78 | | 4,732,355.80 | |
| මුදල් සහ මුදල් සමාන දේවල් | 16 | 110,100,448.47 | 427,176,642.94 | 56,332,496.05 | 377,731,500.15 |
| මුළු වත්කම් | | | 1,310,483,477.56 | | 1,161,053,176.06 |
| බැරකම් | | | | | |
| ප්‍රවර්තන බැරකම් | | | | | |
| ගෙවිය යුතු මුදල් | 17 | 39,199,436.91 | | 26,479,474.98 | |
| උපචිත වියදම් | 18 | 4,535,357.33 | | 3,181,890.27 | |
| ස්වයං මූල්‍ය පාඨමාලා | 19 | 28,704,364.46 | 72,439,158.70 | 18,716,302.51 | 48,377,667.76 |
| ප්‍රවර්තන නොවන බැරකම් | | | | | |
| ගෙවිය යුතු මුදල් | 20 | 2,991,303.32 | | 3,414,334.24 | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 135,033,460.14 | | 86,400,033.59 | |
| සීමාසහිත අරමුදල් | 21 | 155,942,016.27 | 293,966,779.73 | 146,910,334.10 | 236,724,791.93 |
| මුළු බැරකම් | | | 366,405,938.43 | | 285,102,369.69 |
| මුළු ශුද්ධ වත්කම් | | | 944,077,539.13 | | 875,950,806.37 |
| ශුද්ධ වත්කම්/කොටස් | | | | | |
| සමුච්චිත අරමුදල් (ප්‍රාග්ධන ප්‍රදානය) | 22 | 1,563,769,866.25 | | 1,421,865,173.45 | |
| සංචිතය | | | | | |
| පොදු සංචිතය | 23 | (731,042,286.84) | | (654,187,177.23) | |
| බැඳුම්කර බැඳීම් සංචිතය | 24 | 111,292,099.72 | | 108,214,950.15 | |
| ප්‍රාග්ධන සංචිතය | | 57,860.00 | 944,077,539.13 | 57,860.00 | 875,950,806.37 |

| | සටහන | 2006 දෙසැ. 31 දිනට | | 2005 දෙසැ. 31 දිනට | |
|---|---|---|---|---|---|
| | | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| මුළු ශුද්ධ වත්කම්/කොටස් | | | 944,077.539.13 | | 875,950,806.37 |
| මුළු බැරකම් | | | 366,405,938.43 | | 285,102,369.69 |
| මුළු බැරකම් සහ කොටස් | | | **1,310,483,477.56** | | **1,161,053,176.06** |

(යොදා ගත් මුළු අරමුදල)

නිවැරදි බවට සහතික කරනු ලැබේ.

මහාචාර්ය ආර්. කුමාරවඩිවේල්,
ගණක නිලධාරි,
උපකුලපති.

කේ. කනගරත්නම්,
මූල්‍යාධිකාරී.

**යාපනය විශ්ව විද්‍යාලයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

යාපනය විශ්ව විද්‍යාලයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සහ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ. මුදල් පනතේ 13(7)ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2007 සැප්තැම්බර් 01 දින විශ්ව විද්‍යාලයේ උප කුලපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනිකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසුද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මාගේ උපරිම තොරතුරු සහ මට සපයන ලද පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2:2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් ඇතිවන බලපෑම් හැර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ මූල්‍ය ප්‍රකාශනයන්හි දී ඇති සටහන් වල (අංක 1-24) දක්වා ඇති වූ පරිදි වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් එමගින් 2006 දෙසැම්බර් 31 දිනට යාපනය, විශ්ව විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයෙහි සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරන බවත් මාගේ මතය වේ.

2.2 ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

රු. 677,731,301 ක් වූ වියදමට අදාළ ගනුදෙනු පිළිබඳව නියැදි පදනමින් කරන ලද විගණන සෝදිසි පරීක්ෂණයකදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු දහ නවයක් විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. එබැවින් වෙනත් ක්ෂේත්‍රවලද එවැනි ගිණුම්කරණ අඩුපාඩු තවදුරටත් තිබීමේ හැකියාව බැහැර කළ නොහැක.

2.2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුළු ගණන පිළිවෙලින් රු. 395,729,546 ක් හා රු. 37,862,597 ක් වූ ණයගැතියන්ගෙන් හා ණය හිමියන්ගෙන් සනාථ කිරීම් කැඳවා නොතිබුණි.

(ආ) මුළුගණන රු. 153,185,886 ක් වූ ණයගැතියන් හා මුලු ගණන රු. 39,184,186 ක් වූ ණය හිමියන් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

වටිනාකම රු. 349,596,718 ක් වූ වත්කම් සහ මුළු ගණන රු. 671,888 ක් වූ වියදම් අවශ්‍ය සාක්ෂි නොමැති වීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

2.2.4 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ රජයේ මුදල් රෙගුලාසි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි නොයෙකුත් විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා තිබුණු අතර, එම අනුකූල නොවීම් පිළිබඳව විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා වෙත නිකුත්කරන ලද මාගේ සවිස්තරාත්මක වාර්තාවේ පෙන්වා දෙන ලදී.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIV වගන්තියෙහි 112, 113, 114. 115, 116, 117 ඡේද සහ 118 ඡේදයෙහි 19(එච්) උප වගන්තිය

(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) (ඩී) වගන්තිය

(ඇ) 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18(6) සහ 18(7)

(ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය.

III පරිච්ඡේදයේ 22(3) වගන්තිය
V පරිච්ඡේදයේ 7:6, 7:6:2 සහ 7.8 වගන්ති
XIV පරිච්ඡේදයේ 4 වගන්තිය
XVII පරිච්ඡේදයේ 9.1 වගන්තිය
XX පරිච්ඡේදයේ 3:1 වගන්තිය
XXV පරිච්ඡේදයේ 2:2 (එෆ්) වගන්තිය
XXVI පරිච්ඡේදයේ 2.4 හා 5 වගන්ති
XXVII පරිච්ඡේදයේ 9:4 වගන්තිය
XXIV පරිච්ඡේදයේ 3.3 වගන්තිය
XXIV පරිච්ඡේදයේ 3:1 වගන්තිය

(ඊ) 1980 පෙබරවාරි 15 දිනැති අංක 63, 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94, 1997 ඔක්තෝබර් 17 දිනැති අංක 720(1) හා 1986 මැයි 09 දිනැති අංක 367 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

(උ) 1979 ජූලි 29 දිනැති අංක 828, 2002 සැප්තැම්බර් මස 30 දිනැති අංක 364(3) සහ 1989 ජූනි 16 දිනැති අංක පීඊඩී/52 (5.4 (බී) සහ 113(7) ඡේද) දරන භාණ්ඩාගාර චක්‍රලේඛ

(ඌ) මුදල් රෙගුලාසි 103(1), 104, 104(2), 109, 154, 264, 396, 447, 688(2)(එෆ්), 700(5), 702(3), 751(1), 757(2)(ඒ) සහ 1646

(එ) 1989 මාර්තු 23 දිනැති අංක 19/89 සහ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(ඒ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 සහ 3.6 ඡේද

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 569,834,728 ක ඌනතාවයක් අත් වී තිබුණු අතර, පෙර වර්ෂය සඳහා වූ අනුරූපී ඌනතාවය රු. 457,391,785 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 503,400,000 ක ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත

වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 66,434,728 දක්වා අඩුවී තිබුණු අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 391,000,000 ක ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව එම වර්ෂයේ ඌනතාවය රු. 66,391,785 දක්වා අඩු වී තිබුණි.

3.2 නිශ්චිත අරමුදල් උපයෝජනය

නිශ්චිත අරමුණු සඳහා ලැබුණු ප්‍රදාන සහ ඒ මත වූ පොලිය ද ඇතුළුව මුළු ගණන රු. 36,241,239 ක් ඒවා ප්‍රදානය කරන ලද අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කෙරේ :-

(අ) විශ්ව විද්‍යාලය මගින් ස්වයං මූල්‍යයන පාඨමාලා දහඅටක් පවත්වා තිබුණි. එහෙත් ස්වයං මූල්‍යයන පාඨමාලා කිසිවක් නියමිත කාල සීමාව තුළදී නිමකර නොතිබුණි. 2005 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු ඇතැම් එක් අවුරුදු පාඨමාලා 2007 අප්‍රේල් 30 දින වන විටද සම්පූර්ණ කර නොතිබුණි. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, එක් ශිෂ්‍යයකුගේ ගාස්තුව වශයෙන් රු. 20,000 සිට රු. 34,000 බැගින් රු. 17,505,279 ක් ස්වයං මූල්‍යයන පාඨමාලා සඳහා රැස්කර තිබුණු අතර, විශ්ව විද්‍යාලයට අනුයුක්ත කථිකාචාර්යවරුන්ට දේශන ගාස්තු ලෙස රු. 5,852,301 ක් ගෙවා තිබුණි. තවද එක් එක් ස්වයං මූල්‍යයන පාඨමාලාව හදාරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව, සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව, විශ්ව විද්‍යාලයට සහ පාඨමාලා හදාරන ලද ශිෂ්‍යයින්ට ලැබූ ප්‍රතිලාභ සම්බන්ධයෙන් වූ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. විශ්ව විද්‍යාලයට හෝ ශිෂ්‍යයින්ට ප්‍රතිලාභ ලැබී නොතිබුණු බැවින් කථිකාචාර්යවරුන්ගේ ස්ථිර තනතුරට ගෙවන වැටුප්වලට අමතරව ඔවුන්ගේ ආදායම් වර්ධනය කර ගැනීම සඳහා මෙම ස්වයං මූල්‍යයන පාඨමාලා පවත්වා තිබුණු බව පෙන්නුම් කෙරිණි.

(ආ) විශ්ව විද්‍යාලයේ විවිධ අධ්‍යයනාංශ සහ සේවා අංශ සඳහා සෘජු දුරකථන මාර්ග හැට එකක් ලබා දී තිබුණු අතර, අභ්‍යන්තර දුරකථන පද්ධතිය පාවිච්චියට නොගෙන බොහොමයක් සෘජු දුරකථන මාර්ග අභ්‍යන්තර සන්නිවේදන කටයුතු සඳහා යොදාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දුරකථන ගාස්තු ලෙස රු. 2,063,681 ක් ටෙලිකොම් සමාගමට ගෙවා තිබුණි. අභ්‍යන්තර දුරකථන පද්ධතිය සම්පූර්ණ ධාරිතාවෙන් යුතුව භාවිතා කරනු ලැබුවේ නම් මුළු දුරකථන ගාස්තුව රු. 452,471 ක් දක්වා අඩු කර ගත හැකිව තිබුණි.

(ඇ) වානේ අල්මාරියක් සහ කේඩිකේ පාදස්තල විදුලි පංකාවක් මිලදී ගැනීමේදී රු. 10,680 ක් වැඩිපුර ගෙවා තිබුණු බැව් විගණනයේ දී නිරීක්ෂණය විය.

3.4 නිශ්ඵල වියදම්

(අ) මාධ්‍ය සම්පත් පුහුණු මධ්‍යස්ථානයක් සඳහා රු. 24,000 ක් පිරිවැය වූ සන්ටෙල් දුරකථන පහසුකම් ලබාගෙන තිබුණි. ඒ අවස්ථාවේ දීම රු. 23,000 ක් පිරිවැය වූ නවකේබල් සම්බන්ධතාවයක්ද ඉහතකී ඒකකයට සපයා තිබුණි. ඒ හේතුවෙන් රු. 24,000 ක් වූ සන්ටෙල් දුරකථන සම්බන්ධතා ගාස්තු නිශ්ඵල වියදමක් බැව් විගණනයේ දී සැලකිය හැක.

(ආ) විශ්ව විද්‍යාල සභාව විසින් මාස 14 ක වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු අනුමත කර මහාචාර්යවරයෙකුට සහ ඔහුගේ කලත්‍රයාට ගුවන් ගමන් ගාස්තු ගෙවා තිබුණි. ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්ව විද්‍යාලයේ මනෝ චිකිත්සක දෙපාර්තමේන්තුවේ බාහිර සම්මාන සාමාජිකයෙකු ලෙස පත් කිරීමේ ලිපියක් ඔහු විසින් ඉදිරිපත් කර තිබුණි. අවශ්‍යතා සම්පූර්ණ නොවී තිබුණු හෙයින් අනුමත සප්ත වාර්ෂික නිවාඩු කාලය තුල 2007 අප්‍රේල් මස 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි මනෝ චිකිත්සාව සම්බන්ධ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරින් ඉල්ලා අස් වී තිබුණි. ඒ අනුව විශ්ව විද්‍යාලයට ඔහුගේ සේවය අහිමි විය. නමුත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 22 වගන්තිය ප්‍රකාරව සප්ත වාර්ෂික නිවාඩු සහ ගුවන් ගමන් ගාස්තු පහසුකම් සඳහා ඔහුට අයිතිවාසිකමක් නොතිබුණි. එබැවින්, රු. 148,522 ක් වූ ගුවන් ගමන් ගාස්තු නිශ්ඵල වියදමක් ලෙස විගණනයේ දී සලකන ලදී.

3.5 හෙමින් වැය වන, නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

විශ්ව විද්‍යාලයේ පහත සඳහන් වත්කම් විෂයයන් හෙමින් වැය වෙන, නිශ්ක්‍රීය හා අඩුවෙන් ප්‍රයෝජනයට ගන්නා වත්කම් බැව් විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) ස්කූටර් දෙකක් වසර පහකට වඩා කාලයක් පාවිච්චි කර නොතිබුණි.

(ආ) ප්‍රසිද්ධ කරන ලද පොත් 4,229ක් දීර්ඝ කාලයක් තිස්සේ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය ගබඩාව තුළ නිශ්කාර්යව තබා තිබුණි.

(ඇ) රු. 750,000කට මිලදී ගන්නා ලද මල්ටි ස්ටේෂන් (Multi Station) යන්ත්‍රයක් (Poly Station Gym) වර්ෂයකට වඩා අධික කාලයක් ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී එක් ත්‍රීරෝද රථයක් කි. මී. 753ක් පමණක් ධාවනය කර තිබුණි.

(ඉ) රු. 79,925 ක් පිරිවැය වූ රෝනියෝ යන්ත්‍රයක් (Super Fax Re 450) සහ පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් පාවිච්චියට නුසුදුසු සේ සලකා වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ බාහිර විභාග ශාඛාවේ තබා තිබුණි.

(ඊ) කළමනාකරණ පීඨය ඉදි කිරීම සඳහා මිලදී ගෙන තිබුණු රු. 6,589,667 ක් වටිනාකම වූ ඉඩමක් වසර 2කට වැඩි කාලයක් පාවිච්චියට ගෙන නොතිබුණි.

(උ) ශේෂය රු. 10,576 ක් සහිත බැංකු ගිණුමක් විශ්ව විද්‍යාලය විසින් වසර තුනකට වැඩි කාලයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඌ) මුළු ගණන රු. 361,967 ක් වූ වර්ග හයකට අයත් පාරිභෝගික විෂයයන් 6,610ක් වසර පහකට වැඩි කාලයක් ගබඩාවල නිශ්කාර්යව පැවතුණි.

(එ) රු. 182,400 කට මිලදී ගත් වේලා සටහන් කිරීමේ යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඒ) වවුනියා මණ්ඩපය සඳහා රු. 120,400 කට මිලදී ගත් පොත් රාක්ක 8 ක් වසරකට වඩා වැඩි කාලයක් පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඔ) සේවක පොදු කාමරය හා නිර්මාණ සංගීත අංශයේ පරිපාලන ගොඩනැගිල්ල, කලා හා නිර්මාණ අධ්‍යයනාංශයේ දේශන ශාලාව සඳහා රු. 3,978,386 ක් වැය කර ඉදි කර තිබුණු ගොඩනැගිලි, කොටස් වශයෙන් හෝ පූර්ණ වශයෙන් වසරකට වඩා පාවිච්චියට ගෙන නොතිබුණි.

3.6 කළමනාකරණ අකාර්යක්ෂමතාවයන්

සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂයේදීත් ඵලදායී ආයෝජනයක් සඳහා උපයෝජනය නොකර බාහිර විභාග අංශයේ ජංගම ගිණුමේ විශාල මුදලක් නිශ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය. 2004 සිට 2006 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රු. 16,342,523 සිට රු. 105,227,329 ක පරාසයක් තුළ වූ ශේෂ මෙම ජංගම ගිණුමෙහි පැවතුණි.

3.7 හඳුනාගන්නා ලද පාඩු

2004 වර්ෂය තුළ නැති වූ රු. 296,822 ක් වූ ස්ථාවර වත්කම් හා ගබඩා ද්‍රව්‍යවල වටිනාකම සමාලෝචිත වර්ෂය තුළ කපාහැර තිබුණි.

3.8 ව්‍යාපෘති ප්‍රමාද වීම්

(අ) 1989 සිට ගිවිසුම් වලට එළඹ තිබුණු නොයෙකුත් ව්‍යාපෘති යටතේ වූ ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.

(ආ) වෛද්‍ය පීඨයෙහි ශ්‍රවනාගාරයක් ඉදි කිරීම වෙනුවෙන් 1999 සිට 2000 දක්වා කාලය තුළ කොන්ත්‍රාත් සමාගමකට රු. 7,611,885 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු මේ දක්වා නිම කර නොතිබුණි. මෙම අනවශ්‍ය ප්‍රමාදය හේතුකොටගෙන ඉදිකිරීම් පිරිවැය විශාල වශයෙන් වැඩි වී ඇති අතර, ව්‍යාපෘතියේ අරමුණුද ළඟා කර ගෙන නොතිබුණි. මීට අමතරව, මෙම වාර්තාවේ දිනය වන විටද වැඩ ආරම්භ කර නොතිබුණු ශ්‍රවනාගාරයේ, අභ්‍යන්තර සැරසිලි කිරීම සඳහා 2005 සහ 2006 වර්ෂවලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. 13,000,000 ක් ගෙවා තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා සෘජුව යොදාගෙන තිබුණු සේවකයන්ට ගෙවන ලද වැටුප් හා වේතන වලට අමතරව අලුත්වැඩියා කටයුතුවලට අදාළ ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රු. 2,494,153 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට නඩත්තු ගබඩාවේ පාවිච්චි නොකරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය විෂයයන් තිබුණු නමුත් නඩත්තු වැඩ සඳහා ලබා දී තිබුණු ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් සවිකිරීම් වල ඉතිරි ශේෂයන් නඩත්තු ගබඩාවේ නොමැති බව සඳහන් කරමින් ගොඩනැගිලි නඩත්තු සම්බන්ධ කාර්ය භාර ඉංජිනේරුවරයා විසින් වාර්තාවක් ලබා දී තිබුණි. කෙසේ වුවද. විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලි සතුටුදායක ලෙස නඩත්තු කර නොතිබුණි.

(ඈ) තිරුනල්වේලි ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා ජල ටැංකියක් ඉදි කිරීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අත්තිකාරම් ලෙස 1989 වර්ෂයේ දී රු. 2,000,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ජල ටැංකිය ඉදි කිරීම මේ දක්වා නිමකර නොතිබුණි. තවද, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධ සවිස්තර තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. ඉදිකළ කාර්යයන්ද මේ වන විට ගරා වැටුණු තත්ත්වයෙන් තිබුණු බැව් නිරීක්ෂණය විය.

(ඉ) යෝජිත ඉංජිනේරු පීඨය සඳහා පරිපාලන වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනයෙහි රු. 1,050,200 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ නමුත් මේ දක්වා යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් පිහිටුවා නොතිබුණි.

3.9 අධ්‍යයන කාර්ය මණ්ඩලයට පත් කිරීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාමාන්‍ය රීතියක් හැටියට විශ්ව විද්‍යාලයේ ස්ථිර කථිකාචාර්ය තනතුරු සඳහා එක් එක් පීඨයට වෙන් වෙන්ව බඳවාගෙන තිබුණු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කථිකාචාර්යවරු කිහිපදෙනෙකු එකම අධ්‍යයන ක්ෂේත්‍රයේ යොදවාගෙන තිබුණි. විවිධ පීඨ සඳහා කාල සටහන් සකස් කිරීමේදී අනෙකුත් පීඨවල සිටින ස්ථිර කථිකාචාර්යවරුන් පිළිබඳ සැලකිල්ලක් දක්වා නොතිබුණි, වෙනත් පීඨයක් සඳහා ස්ථිර කථිකාචාර්යවරයෙකුගේ සේවය අවශ්‍ය විටකදී බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස වෙනම පත්වීමේ ලිපියක් නිකුත් කර එවැනි සේවා සඳහා අතිරේක දේශන ගාස්තු ගෙවා තිබුණි.

(ආ) බඳවා ගැනීමේ පටිපාටිය නියමිත පරිදි අනුගමනය නොකර බොහෝ අවස්ථාවලදී තාවකාලික කථිකාචාර්යවරුන්, උපදේශකයින් (tutors) සහ ප්‍රදර්ශකයින් අධ්‍යයනාංශ ප්‍රධානීන්ගේ ඉල්ලීම මත පත්කර තිබුණි.

(ඇ) විශ්ව විද්‍යාල පද්ධතිය තුළ රැකියා අපේක්ෂා කරන සුදුසුකම් සහිත අයට තරගකාරීව ඉදිරිපත් වීමට අවස්ථාව ලබා නොදී අවිධිමත් පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය සිරිතක් වී තිබුණි. ඉකුත් වර්ෂවලට අදාළ මාගේ වාර්තාවලින් මේ සම්බන්ධයෙන් පෙන්වා දී තිබුණු නමුත් මෙම අඩුපාඩුව නිවැරදි කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

3.10 අධ්‍යයන කටයුතු

විවිධ පීඨවල ශිෂ්‍යයන් 5,601ක් වෙනුවෙන් දේශන පැවැත්වීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 414 දෙනෙකු සඳහා වැටුප් හා දීමනා ලෙස රු. 89,702,328 ක් ගෙවා තිබුණි. කෙසේ නමුත්, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් භාරගෙන ඇති ක්‍රියාකාරකම්වල ආර්ථිකභාවය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඇගයීමට හැකිවන පරිදි එක් එක් පීඨයෙහි ශිෂ්‍ය සංඛ්‍යාව, එක් එක් පීඨයේ එක් එක් කථිකාචාර්යවරයා පැවැත්වූ දේශන සංඛ්‍යාව, දේශන/ක්‍රියාකාරකම් පැය ගණන, පවත්වන ලද විභාග ගණන, සමත් වූ ශිෂ්‍යයන් ගණන ආදී තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි.

3.11 පාඨමාලා සහ පවත්වන ලද විභාග

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විශ්ව විද්‍යාලයේ පාඨමාලා 10 වෙනුවෙන් ලියාපදිංචි වී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,601 කි. මෙම පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද පුනරාවර්තන වියදම රු. 323,812,766කි. එක් ශිෂ්‍යයකු සඳහා වර්ෂයේ සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු. 57,813 කි.

(ආ) විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨය යටතේ විවිධ පාඨමාලා සඳහා විභාග පවත්වන ලද දිනය හා විභාග ප්‍රතිඵල නිකුත් කරන ඉලක්ක දිනය තීරණය කර නොතිබුනි. 2005 සහ 2006 වර්ෂවලදී සමහර පීඨවල පවත්වා තිබුණු විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමට සැහෙන ප්‍රමාදයක් සිදුවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. 1995 ජූලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව විභාගය අවසන් වී මාස තුනක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. නමුත් මාස 06 සිට 12 දක්වා කාල පරාසයක් ප්‍රතිඵල ප්‍රමාද වී තිබුණි.

3.12 පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා පඩි සහිත සහ පඩි රහිත නිවාඩු අනුමත කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X පරිච්ඡේදයේ 27.4 වගන්තියේ උපදෙස් සැලකිල්ලට නොගෙන උසස් අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගත වූ කථිකාචාර්යවරුන්ට එක් වසරකට වැඩි කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි.

(ආ) පරිවාස කාලයේ සිටින කථකාචාර්යවරුන්ටද අධ්‍යයන නිවාඩු අනුමත කළ අවස්ථා තිබුණි.

3.13 අයවැය ලේඛනය පාලනය

අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර, සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බැව් දක්නට ලැබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) සේවක කළමනාකරණය
(ආ) අයවැය ලේඛනය
(ඇ) මිලදී ගැනීම්

(ඇ) ගබඩා
(ඉ) ණයගැතියෝ
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) පුස්තකාල පරිපාලනය
(ඌ) ස්ථාවර වත්කම්
(එ) අභ්‍යන්තර විගණනය

පී. ඒ. පේමතිලක
විගණකාධිපති.

**2006 දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වූ වර්ෂය සඳහා යාපනය විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳව විගණකාධිවරයා ගේ වාර්තාව ගැන යාපනය විශ්ව විද්‍යාලයේ පාලන බලධාරියාගේ නිරීක්ෂණ**

2.2.2 (අ) ලැබිය යුතු මුදල් වැඩි හරියකින් නියෝජනය වන්නේ සේවකයන්ට ගෙවන ලද ණය වලින්/අත්තිකාරම් වලින් ඉතිරිව තිබුණු ශේෂයයි. ගෙවිය යුතු මුදල් ගිණුමෙන් නියෝජනය වන්නේ ශිෂ්‍යයන්ගේ තැන්පතු සහ කාර්ය මණ්ඩලයේ ඇප තැන්පතුය. එහෙයින් තහවුරු කිරීම් අනවශ්‍යය.

(ආ) රු. 192,370 ක් වූ මුදල පිළිබඳ විස්තර විගණනය විසින් ඉදිරිපත් නොකිරීම නිසා ඒ පිළිබඳ කරුණු කිසිවක් දැක්වීමට අපට පුළුවන් කමක් නැත. එසේ වුවද සැපයුම් අත්තිකාරම් ඇතුළු සියලු ණය/අත්තිකාරම් සඳහා ආයු විශ්ලේෂණ දී තිබේ.

2.2.3 රු. 1,350,268,606 ක් වූ මුදල පිළිබඳ විස්තර විගණනය විසින් ඉදිරිපත් නොකිරීම හේතුකොට ගෙන මෙම නිරීක්ෂණය පිළිබඳ කරුණු කිසිවක් දැක්වීමට අපට පුළුවන් කමක් නැත.

2.2.4 මෙම විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාල පනතේ ද ආයතන සංග්‍රහයේ ද චක්‍රලේඛවල ද සඳහන් විධිවිධාන හැකිතාක් දුරට පිළිපදී.

3.3 (අ) 2006 වර්ෂයේ දී උපාධිධාරී අධ්‍යයන පීඨය විසින් පවත්වන ලද්දේ ශිෂ්‍ය කණ්ඩායම් නවයක් සඳහා එකිනෙකට වෙනස් වූ ස්වයං මූල්‍යකරණ පාඨමාලා එකොළහක් පමණි. (ඒවායින් සමහරක් දෑවුරුදු පාඨමාලා සමහර පාඨමාලා මධ්‍යස්ථාන දෙකක පැවැත්වේ). නියමිත කාලය තුළදී අධ්‍යයන පාඨමාලා අවසන් කිරීම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වූයේ විශ්ව විද්‍යාලයෙන් බාහිර වූ වැඩි දෙනෙකුගෙන් සමන්විත දෙවෙනි පරීක්ෂකවරුන් ලවා පිළිතුරු පත් ලකුණු කරවා ගැනීමට සිදු වීමය. මීට අතිරේක වශයෙන්, විශ්ව විද්‍යාලය තුළ සහ ඒ අවට පැවති තත්ත්වය හේතු කොට ගෙන ද සැලකිය යුතු ප්‍රමාදයක් ඇති විය. දැනට මෙම පාඨමාලා නියමිත කාලය තුළදී අවසන් කිරීමට අපි හැම උත්සාහයක් ම දරමින් සිටිමු.

උපාධිධාරී අධ්‍යයන පීඨයෙන් පැවැත්වෙන පාඨමාලා ඉතා ජනප්‍රිය ඒවා මෙන්ම ශිෂ්‍යයන්ගේ වෘත්තීය සංවර්ධනයට මෙන්ම සමාජයට ඔවුන්ගේ සේවය ප්‍රබල ආකාරයෙන් ඉටු කිරීමටද ප්‍රයෝජනවත් වේ. මේ හැරුණු විට විශ්ව විද්‍යාලයේ වැදගත් පරමාර්ථ වලින් එකක් වන විශ්ව විද්‍යාලයට තම මෙහෙවර මුදුන්පත් කර ගැනීමට ද අවස්ථාව සැලසෙන්නේ මේ පාඨමාලා නිසාය.

උපාධිධාරී අධ්‍යයන පීඨය පන්ති පවත්වන්නේ සති අන්තවල සහ වැඩකරන කාර්යාල වේලාවෙන් පසුව පමණි. එහෙයින් මේ පාඨමාලා වලින් විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට කවරාකාරයකින් හෝ බාධාවක් සිදු නොවේ.

(ආ) මෙම වියදම අභ්‍යන්තර සන්නිවේදනය සඳහා පමණක් නොවේ. එය අභ්‍යන්තර හා බාහිර යන දෙවර්ගයේම සන්නිවේදනය සඳහා වූ වියදමයි.

දුරකථන 61 සඳහා වාර්ෂික ගාස්තු මෙසේය.

| | | |
|---|---|---|
| 61 x 12 1250 | 915,000.00 | |
| ගාස්තුව මත 15% VAT බද්ද | 137,250.00 | 1,052,250.00 |
| දුරකථන මාර්ග 61 සඳහා වෙන්කර දී ඇති වාර්ෂික භාවිත කිරීමේ සීමා මෙසේය. | | |
| 51 x 12 x 1500 (දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට) | 918,000.00 | |
| 9 x 12 x 3500 (පීඨාධිපති, පුස්තකාලයාධිපති, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරිවරුන්ට) | 378,000.00 | |
| 1 x 12 x 5000 (උපකුලපතිට) | 60,000.00 | |
| දුරකථන භාවිතය සඳහා වෙන්කළ මුදල මත 15% VAT බද්ද | 203,400.00 | 1,559,400.00 |
| | | 2,611,650.00 |

දුරකථන ඇමතුම් සඳහා වාර්ෂික වියදමේ උපරිම සීමාව රු. 2,611,650 කි. එසේ වුවද, 2006 වර්ෂයේ දී දුරකථන ඇමතුම් සඳහා වූ සැබෑ වියදම රු. 2,063,681 කි. එහෙයින් මෙම වියදම අනුමත මුදල ඇතුළත පවතී.

ශ්‍රී ලංකාවේ සියලුම විශ්ව විද්‍යාලවල ස්වකීය ඉන්ටර්කොම් දුරකථන පද්ධති තිබෙන නමුත් සියලුම අධ්‍යයන අංශවලට /මධ්‍යස්ථානවලට/ඒකකවලට සහ පරිපාලන ශාඛාවලට සෘජු දුරකථන මාර්ග සපයා තිබේ. අංශවලට සෘජු දුරකථන පහසුකම් සැපයීම ප්‍රතික්ෂේප කළ නොහැකිය. එසේ වුවද යාපනය විශ්ව විද්‍යාලයෙහි ඇතැම් අධ්‍යයන අංශවලට මේ වන තෙක් සෘජු දුරකථන මාර්ග සපයා නැත.

යාපනයට දශකයකටත් වැඩි කාලයක් (1985-1999) තුළ දුරකථන පහසුකම් තිබුණේ නැත. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය අපට පමණක් සීමාසහිත සම්බන්ධතා කීපයක් දී තිබිණ. 1995ට පෙර අපට තිබුණේ ඉන්ටර්කොම් පහසුකම්ය. මේ පරණ ක්‍රමය නිතර නිතර ක්‍රියාවිරහිත විය. එහි අලුත්වැඩියාවන් සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සහාය පැතූ විට ඔවුන් කියා සිටියේ ඒවා අලුත්වැඩියා නොකළ හැකි බැවින් අලුතින් PABX පද්ධතියක් මිලදී ගන්නා ලෙසය. 2002 වර්ෂයේ දී නව PABX පද්ධතියක් මිලදී ගැනීමට අප සැලසුම් කරමින් සිටින විට SIDA සංවිධානයේ අරමුදලින් තොරතුරු තාක්ෂණ ජාල ව්‍යාපෘතියක් අපට අනුමත විය. මේ ව්‍යාපෘතියට ඉන්ටර්කොම් පහසුකම් ද ඇතුළත් විය. එහෙයින් නව PABX පද්ධතිය පිළිබඳ සැලැස්ම අත්හැර දමන ලදී. SIDA අරමුදලින් සපයන ලද ජාල ව්‍යාපෘතිය හොඳින් ක්‍රියාත්මක වූ නමුත් අවාසනාවකට මෙන් 2006 අප්‍රේල් මාසයෙන් පසු කොළඹින් පැමිණි පුහුණු සේවකයෝ යාපනයට ඒමට මැළි වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කොන්ත්‍රාත්කරුවන් වූ කොළඹ එන්ටර්ප්‍රයිස් ටෙක්නොලොජි(ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමට ඉතිරි වැඩ කොටස අවසන් කළ නොහැකි විය.

ජාලකරණ වැඩ සටහන අත්හැර දැමීමට කොන්ත්‍රාත්කරුවන් තීරණය කරන්නේ නම් PABX පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අපි තීරණය කරන්නෙමු. නැවත වැඩ පටන් ගැනීමට කොන්ත්‍රාත්කරුවන් පොළඹවා ගැනීම සඳහා අපි දැන් උත්සාහ කරමින් සිටිමු. ඒ නිසා -

(අ) පද්ධතිය අලුත්වැඩියා කිරීමට පියවර ගෙන නැතැයි ද තීරණය කිරීම සුදුසු නැත,

(ආ) අභ්‍යන්තර ඇමතුම් හේතුකොට ගෙන දුරකථන සන්නිවේදන වියදම පිළිගත නොහැකි තරම් ඉහළ ගොස් ඇත.

(ඇ) විගණනයෙහි සඳහන් කර ඇති පරිදි වැඩිපුර ගෙවීමක් සිදු වී නැත. කේ. ඩී. කේ. පාදස්ථ පංකාව සහ වානේ කබඩ් එක මිලදී ගන්නා ලද්දේ වෙනස් වෙනස් මිල ගණන් දෙකකටය. පළමු කේ. ඩී. කේ. පංකාව මිලදී ගන්නා ලද්දේ 2006 සැප්තැම්බර් මස රු. 4,900කටය. දෙවැන්න මිලදී ගන්නා ලද්දේ 2006 ඔක්තෝබර් මස රු. 7,000කට ය. මුල් සැපයුම්කරු ළඟ භාණ්ඩ තොග නොතිබුණු බැවින් දෙවෙනි මිලදී ගැනීම රු. 7,000ට වෙනත් සැපයුම්කරුවකුගෙන් ලබා ගන්නා ලදි. පළමුවැනි වානේ කබඩ් එක 2006 ජූලි මස රු. 11,250ට මිලදී ගන්නා ලදී. දෙවෙනි කබඩ් එක මිලදී ගන්නා ලද්දේ 2006 ඔක්තෝබර් මස රු. 10,490කට ය. මිල අඩු වැඩි වීම යාපනයේ නිරන්තරව සිදුවන දෙයකි.

3.4 (අ) නව සම්බන්ධය ලබාගත්තේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙනි. එහෙයින් සන්ටෙල් ආයතනයට ගෙවූ මුදල ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සවි කිරීමේ ගාස්තුවලින් අඩුකළ නොහැකි විය. තව ද සන්ටෙල් ආයතනය දුරකථන පහසුකම් විසන්ධි කළ විට මුදල් ආපසු ගෙවන්නේ නැත.

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ X වන පරිච්ඡේදයේ 22 වැනි වගන්තිය ප්‍රකාර, තම තනතුරෙන් ඉල්ලා අස්වන බවට දැනුම් දීමක් ඉදිරිපත් කර ඇති සේවකයෙකු/සේවිකාවකට එසේ දැනුම් දුන් කාලය තුළ කිසිම වාර්ෂික නිවාඩුවක් හෝ අනියම් නිවාඩුවක් ලබා ගැනීමට හිමිකමක් නැත. තම තනතුරෙන් ඉල්ලා අස්වන බව මාස තුනකට කලින් 2007.04.03 දරන ලිපියෙන් මහාචාර්ය සෝමසුන්දරම් දැනුම් දුන් නමුත් එය භාර ගත්තේ නැත. ඔහුගේ ඉල්ලා අස්වීම ක්‍රියාත්මක වීමේ දිනය වශයෙන් සලකන ලද්දේ 2007.04.03 දිනය. එහෙයින් ඔහුගේ මාස තුනක වැටුපට සමාන මුදලක් විශ්ව විද්‍යාලය සමග ඔහු එළඹුණු ගිවිසුම ප්‍රකාර, ඔහුගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගන්නා බව උපකුලපතිවරයාගේ 2007.05.21 දින දරන ලිපියෙන් ඔහු වෙත දන්වන ලදී. එහෙයින් ඉල්ලා අස්වන බව දැනුම් දුන් ලිපියේ සඳහන් දින සිට සේවය අවසන් වන දිනය දක්වා මහාචාර්ය සෝමසුන්දරම් ට කිසිම නිවාඩුවක් අනුමත කර නැත.

සප්තාබ්දික නිවාඩු වූ කලී එක්තරා කාල පරිච්ඡේදයක් විශ්ව විද්‍යාලයට සේවය කිරීමෙන් පසු ඇතැම් වර්ගවල සේවකයන්ට දෙනු ලබන ඔවුන් උපයා ගත් නිවාඩුවක් වන බැවින් එම නිවාඩු ප්‍රමාණවත් වලංගු හේතු නැතිව අවලංගු කළ නොහැකිය. මහාචාර්ය සෝමසුන්දරම් සප්තාබ්දික නිවාඩු මත සිටි අතර ඔහු සිය ඉල්ලා අස්වීමේ ලිපිය ඉදිරිපත් කළ අවස්ථාව වන විට ඔහු නිවාඩු කාලයෙන් මාස 11 ක් (2006.05.02 සිට 2007.04.02 දක්වා) සම්පූර්ණ කර තිබිණි. එසේ වුවද මහාචාර්ය සෝමසුන්දරම් රාජකාරියට ආපසු නොඑන බැවින් ආපසු ඒමේ ගුවන් යානා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීමේ හිමිකමක් ඔහුට නැත. මහාචාර්ය සෝමසුන්දරම් දැනටමත් ඔහුගේ ආපසු ඒමේ ගුවන් යානා ප්‍රවේශ පත්‍රය කොළඹ ඒයිට්කන් ස්පෙන්ස් ඔවර්සීස් ට්‍රැවල් සර්විසස් සමාගම වෙත ආපසු එවා ඇත. අදාළ මුදල ඉහත නම් සඳහන් සංචාරක නියෝජිත සමාගමෙන් ආපසු ලබා ගැනීමට පියවර ගෙන තිබේ.

සේවකයෙකුගෙන් ලැබිය යුතු ගාස්තු ගැන ඉල්ලා අස්වීම භාර ගැනීමේ ලිපියෙහි සඳහන් කර නැති බවද සැලකුව මැනවි. ලැබිය යුතු සියලු මුදල් සේවකයාගේ කැමැත්ත ඇතිව අර්ථසාධක අරමුදලෙන් අඩුකර ගනු ලැබේ.

3.5 (අ) මිලදී ගැනීමේ නිලධාරියා අවුරුදු දෙකකට පෙර විශ්‍රාම ගෙන ඇති අතර ඒ වෙනුවට කෙනෙකු පත් කර නැත. මිලදී ගැනීමේ නිලධාරියකු පත්කරනු ලැබූ විට යාපනයේ දී සහ කොළඹ දී ස්කුටරය පාවිච්චි කෙරෙනු ඇත.

(ආ) මේ පොත් රාශියක්ම පර්යේෂණාත්මක ප්‍රකාශන නිසා ඒවාට මහජනයාගෙන් විශාල ඉල්ලුමක් නැත.

(ඇ) "මල්ටි ස්ටේෂන් මැෂිම" 2006 ජූලි මාසයේ දී මිලදී ගත් අතර කෙටි කාලයක් තුළ එය පාවිච්චි කරන ලදී. 2006 අගෝස්තු මාසයේ සිට යාපනයේ පැවැති කලබලකාරී තත්ත්වය නිසා මෙම මැෂිම පාවිච්චි කිරීමට ශිෂ්‍යයනට නොහැකි විය. කෙසේ වුවද උපදේශකයෝ මේ මැෂිම පාවිච්චි කරති.

(ඈ) ත්‍රී වීලරය අරපිරිමැස්මෙන් යුතුව පාවිච්චි කර තිබේ.

(ඉ) පාවිච්චි කරන දෙපාර්තමේන්තුව ඉල්ලන මාදිළිය ම සැපයිය යුතු බවට දැඩි නීතියක් නැති බව සැලකුව මැනවි. Super Fax RE 450 මාදිළිය මෙම විශ්ව විද්‍යාලයේ අංශ කීපයකට පාවිච්චි කරන බැවින් පාරිභෝගික භාණ්ඩ නඩත්තු කිරීම සහ සැපයීම පහසු වනු පිණිස බාහිර ඒකකයටද එම මාදිළියම සැපයීම හිතකර වේ.

(ඊ) අමාත්‍ය මණ්ඩල අනුමතිය ලැබුණු විට ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරනු ලැබේ.

(උ) මේ ගිණුම පවත්වා ගෙන යන්නේ පිටරටින් ලැබෙන මුදල් උපකුලපතිවරයාගේ ශුභසාධන අරමුදලට බැර කිරීමට පහසු වනු පිණිසය. මේ ගිණුම ක්‍රියාත්මක ව තබා ගැනීම පිණිස මෙම ශේෂය කොළඹ 1, යෝක් වීදියේ, ලංකා බැංකුවේ අංක 6197 දරන ජංගම ගිණුමෙහි තබා ගෙන ඇත.

(ඌ) සඳහන් කර ඇති භාණ්ඩ පාවිච්චි කිරීමට පියවර ගනු ලැබේ.

(එ) සේවකයන්ගේ විරෝධතාව හේතු කොට ගෙන වේලාව සටහන් කිරීමේ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට විශ්ව විද්‍යාලයට නොහැකි වී තිබේ.

(ඒ) ඉඩකඩ ව්‍යාප්ත කර ගැනීමේ අපේක්ෂාව මත පොත් රාක්ක මිලදී ගන්නා ලදී. එහෙත් නොවැළැක්විය හැකි හේතු නිසා ඉඩකඩ ව්‍යාප්තිය සිදු නොවිය. එහෙයින් පුස්තකාලයේ ඉඩකඩ නැතිවීමේ හේතුවෙන් ඒවා පසෙක තබා ඇත.

(ඔ) ගොඩනැගිල්ල දැන් පාවිච්චියට ගෙන තිබේ.

3.6 වාර්තාවේ දැක්වෙන බැංකු ශේෂය අදාළ වන්නේ භාණ්ඩාගාරයට අයත් නොවන අරමුදල්වලට විනා ඔබ දක්වා ඇති පරිදි බාහිර ඒකකයට නොවේ. භාණ්ඩාගාරයට අයත් නොවන අරමුදල්වලට ව්‍යාපෘතියේ අරමුදල් සහ පාඨමාලාවල ස්වයං අරමුදල් ඇතුළත් වේ. ඒ නිසා මේ මුදල් ස්ථාවර තැන්පතුවට මාරු කළ නොහැකිය. ව්‍යාපෘති අරමුදල් සහ තමන්ම අරමුදල් සොයා ගන්නා පාඨමාලාවල මුදල් පාවිච්චි කොට ස්ථිර තැන්පතු ගිණුම් විවෘත කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි බව කරුණාවෙන් සැලකුව මැනවි.

(අ) 1989 ට පෙර අත්සන් කරන ලද ගිවිසුම්වලට අදාළ වැඩ කිසිවක් සම්පූර්ණ කිරීමට ඉතිරිව නැත. එහෙත් 1989ට පෙර ආරම්භ කරන ලද කලා පීඨ සංකීර්ණය සහ රාමනාදන් ලලිත කලායතනය අසම්පූර්ණව පවතී. මේවා ඉතා විශාල ව්‍යාපෘති වන බැවින් ඒවායේ වැඩ අදියර මගින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරන ලදී. වැඩ සම්පූර්ණ කර ඇති අදියරවල් (ගොඩනැගිලි) දැනට ප්‍රයෝජනයට ගෙන තිබේ. 1990-1996 කාලය තුළ ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය උතුරට ප්‍රවාහනය කිරීම සම්පූර්ණයෙන් තහනම් කර තිබුණු බවත් එදා පැවති තහනම් නියෝග නිසා 2002 අප්‍රේල් මාසයේ දී ඒ-9 මාර්ගය විවෘත කරන තෙක් ප්‍රවාහන කටයුතු නිදහසේ කළ නොහැකි විය.

(ආ) රු. 76,11,885 ක මුදල ගෙවන ලද්දේ 1 වැනි අදියරේ ඉතිරි වැඩ සඳහායි. ඒවාට නිමහම් වැඩ, අලංකරණය සහ තහඩු දැමීම ආදිය ඇතුළත් නොවිය. අභ්‍යන්තර අලංකරණ වැඩ සඳහා අවශ්‍ය ලේඛන සම්පාදනය කිරීමෙන් පසු ටෙන්ඩර් කැඳවීම තුන්වරක් සිදු කරන ලදී. එහෙත් ඒ කිසිම අවස්ථාවක සතුටුදායක කොන්ත්‍රාත්කරුවකු නිර්දේශ කිරීමට විශ්ව විද්‍යාල ටෙන්ඩර් මණ්ඩලයට නොහැකි විය. පසුව විශ්ව විද්‍යාල සභාව මේ වැඩ කොටස ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පිරිනැමූ අතර වැඩ ආරම්භ කිරීම සඳහා සම්පූර්ණ මුදල කල්තියා ගෙවීම එම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව විය.

(ඇ) නඩත්තු ශාඛාවට නඩත්තු ගබඩාවක් තිබුණේවත්, ගබඩා භාරකරුවෙක් සිටියේවත් නැත. මුදල් ශාඛාවෙන් ලැබුණු ගබඩා ද්‍රව්‍ය ලේඛනයක වාර්තාගත කිරීමෙන් පසු වැඩට නිකුත් කරන ලදී. වැඩට භාණ්ඩ නිකුත් කළ පසු ඉතිරි කිසිවක් නැති සේ සලකන ලදී. වැඩ දිගටම කෙරෙමින් පැවතීම හේතුකොට ගෙන නඩත්තු අංශය වර්ෂාවසානයේ දී වසා නොදැමූ නිසා වැඩහලෙහි වැඩ කොටස් කීපයක් කෙරෙමින් තිබුණා වන්නට පුළුවන. ඇතැම් වැඩ කොටස් දින කීපයක් නොනවත්වා කළ යුතු ඒවාය. විගණකාධිපතිවරයා සඳහන් කර ඇති රු. 24,94,153 ක මුදල් ගොඩනැගිලිවල/ව්‍යුහවල/සේවාවල සුලු අලුත්වැඩියාවන් සඳහා වැය වූ මුදල මිස එදිනෙදා නඩත්තුව සඳහා වැය වූ මුදල නොවේ.

(ඈ) යාපනයේ පැවති යුද්මය තත්ත්වය නිසා 1990 දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මෙම වැඩ අත්හිටවීය. අනතුරුව ළිං දෙකක් සහ පොම්පාගාරයක් තැනීම 1999 දී අවසන් කරන ලදී. වතුර ටැංකියේ වැඩ ද අවසන් කර දෙන ලෙස ඉල්ලමින් ලිපි මගින් සිහි කැඳවීම යවා තිබේ.

(ඉ) මෙම මුදල් වෙන් කර දෙන ලද්දේ යාපනය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ අනුමත සේවක සංඛ්‍යාව සඳහාය. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගොඩනැගිලි සඳහා මුදල් වෙන්කර දීමක් සිදුකර නැත. ඉංජිනේරු පීඨයක් පිහිටුවීම සඳහා නියමිත *ගැසට්* නිවේදනය ද රජය විසින් නිකුත් කර නැත.

3.9 (අ) ඉගැන්වීම් කටයුතුවල යෙදෙන ස්ථිර කාර්ය මණ්ඩලය පීඨය තුළ මෙන්ම, ස්වකීය වැටුපට අමතරව කිසිදු ගෙවීමකින් තොරව පීඨාන්තර ඉගැන්වීම් කටයුතු වල ද යෙදේ. ස්වකීය අංශයෙහි/පීඨයෙහි ගුරුවරයෙකු ඉගැන්වීම් කටයුතුවල ප්‍රමාණය කිසියම් ගුරු තනතුරක අනුමත අධ්‍යයන උපමාන විශාල වශයෙන් ඉක්මවා යන අවස්ථාවල දී, ඔවුන් අයත් පීඨයෙන් බැහැර වූ අංශවල ස්වකීය අධ්‍යයන උපමානවලට අතිරේක වශයෙන් දේශන පැවැත්වීමට සිදුවන විට ඔවුන් බාහිර කථාකාචාර්යවරුන් වශයෙන් පත් කොට ගෙවීම් කරනු ලැබේ. එබඳු බාහිර කථිකාචාර්ය පත්වීම් දෙනු ලබන්නේ අත්‍යවශ්‍යම අවස්ථාවන්හි දී ස්වල්ප සංඛ්‍යාවක් පමණි.

එක් එක් පීඨයේ අවශ්‍යතා පදනම් කරගෙන පීඨවල සේවක සංඛ්‍යා තීරණය කරනු ලබන්නේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. මේ හැරුණු විට "අධ්‍යයන ක්ෂේත්‍රය" බොහෝ දුරට එක සමාන සේ පෙනෙන නමුත්, අදාළ පාඨමාලාවේ විෂය පථය සහ පාඨමාලාවේ අන්තර්ගතය බෙහෙවින් එකිනෙකට වෙනස් විය හැකිය. උදාහරණයක් වශයෙන්, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ගණිතය යන මේ විෂයයන් විද්‍යා පීඨයක ඉගැන්වෙන ආකාරය ඒවා ඉංජිනේරු පීඨයක ඉගැන්වෙන ආකාරයට වඩා වෙනස් වේ.

(ආ) සහකාර කථිකාචාර්ය, නිබන්ධන ආචාර්ය, ප්‍රදර්ශක, උපදේශක යන මේ තාවකාලික තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදන නිරන්තරයෙන්ම එක් එක් අධ්‍යයන වර්ෂය ආරම්භ වීමට කලින් පළ කොට නිසි පරිදි බඳවා ගැනීමේ පරිපාටිය අනුගමනය කරමින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

කෙසේ වුවද පත් කරනු ලැබූ පුද්ගලයකු අධ්‍යයන වර්ෂය තුළ දී ඉල්ලා අස්වුවහොත් හෝ සේවය හැර ගියහොත් නිවේදන මගින් අයදුම්පත් කැඳවා ඇබෑර්තු පිරවීමට කාලය මදිවන අවස්ථාවල දී අදාළ අධ්‍යයන පාඨමාලා නියමිත අධ්‍යයන කාල සටහන් ඇතුළත නිම කළ හැකි වන පරිදි අංශ ප්‍රධානයාගේ හෝ පීඨාධිපතිගේ ඉල්ලීම මත අවස්ථා ස්වල්පයක දී පමණක් පත් වීම් කරනු ලැබේ. (ස්වල්පයක් පමණක් වූ) එබඳු පත්වීම් සිදු කරනු ලබන්නේ ඉල්ලා අස් වූ පුද්ගලයාගේ පත්වීමේ ඉතිරි කාලය සඳහා පමණි.

වැඩ පැවරීම් (හෝ කොන්ත්‍රාත්) පදනම මත ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් කීප දෙනකුගේ සේවය ලබා ගැනීම හැරුණු විට, සුදුසුකම් ඇති අයට තරග කිරීමට අවස්ථාව සලසා නොදී වෙනත් පත්වීම් කිසිවක් සිදු නොකරන ලදී. තනතුරු ඇබෑර්තු වූ විට ඒ සියල්ල සඳහා නිවේදන මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමේ පරිපාටිය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා නීත්‍යානුකූලව පිහිටුවන ලද තේරීම් මණ්ඩල විසින් ඔවුහු ඇගැයීමට ලක් කරනු ලැබෙත්. පත්වීම් සිදු කරනු ලබන්නේ, සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අවස්ථාව සැලසෙන පරිදි තේරීම් කමිටු කරන නිර්දේශ පදනම් කරගෙනය.

3.10 ඉල්ලා ඇති තොරතුරු පීඨවල තිබෙන බැවින් ඉදිරි කාලයේ දී ඒවා ඉදිරිපත් කෙරෙනු ඇත.

3.11 (අ) ඇතැම් පීඨවල විභාග පවත්වනු ලබන්නේ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ය. තවත් ඇතැම් පීඨවල අධ්‍යයන වාර අවසානයේ දී ය. කෙසේ වුවද ප්‍රථම අධ්‍යයන වාරය අවසානයේ පැවැත්වුණු විභාග වල ප්‍රතිඵල, දෙවෙනි අධ්‍යයන වාරයේ ප්‍රතිඵල සමග නිකුත් කරනු ලැබේ. මෙය ඔවුන්ගේ විභාග රෙගුලාසිවලට අනුකූලව කෙරෙන්නකි. මෙසේ කරන්නේ එක් අධ්‍යයන වාරයක ප්‍රතිඵල පමණක් නිකුත් කළහොත් දෙවෙනි අධ්‍යයන වාරයේ දී ශිෂ්‍යයන් පාඨමාලා ඒකක පහෙන් දෙකක් අත්හැර දැමීමට ඉඩ ඇති හෙයිනි. කෙසේ වුවද උපාධි පාඨමාලාවේ සැලැස්ම දැන් වෙනස් කර ඇති බැවින් අලුත් ශිෂ්‍යයන්ගේ ප්‍රතිඵල මාස තුනක් තුළ දී නිකුත් කෙරෙනු ඇත.

3.12 (අ) සහ (ආ) මෙම ඡේදවල සඳහන් කරන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ වගන්ති, අංක 429 සහ 1990.03.02 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයෙන් සංශෝධනය කර ඇති අතර ආචාර්යවරුන්ට අධ්‍යයන නිවාඩු අනුමත කෙරෙන කාලය තීරණය කිරීමේ අභිමතය විශ්ව විද්‍යාලවල පාලක සභාව වෙත පවරා තිබේ.

3.13 අයවැය පාලනය සම්බන්ධයෙන් පහත සඳහන් පියවර ගෙන තිබේ ඃ

(i) අයවැය ලේඛනය මුදල් කමිටුව විසින් සහ පාලක සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබේ ;

(ii) වෙන් කර දී ඇති මුදල ඇතුළත වියදම සමීක්ෂණය කළ හැකි වන පරිදි වැය ලෙජරය පරිගණකගත කොට තිබේ ;

(iii) මාසික සැසඳුම් ප්‍රකාශය (අයවැයගත මුදල- සැබෑ වියදම) මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ ;

(iv) වවුනියා මණ්ඩපයට දෙනු ලබන උප අක් මුදල විශ්ව විද්‍යාලයීය මුදල් ශාඛාවේ දී, වෙනම වැය ලෙජරයක් තබා ගැනීමෙන්, සමීක්ෂණය කරනු ලැබේ.

4.0 (අ) වාර්තාවෙහි සඳහන් කරුණු පිළිබඳ පද්ධති සහ පාලන විධි ප්‍රබල අන්දමින් ක්‍රියාත්මක කිරීමට හැම ප්‍රයත්නයක්ම දරනු ලැබේ. දැනටමත් පහත සඳහන් පියවරවල් ගෙන තිබේ ඃ

(අ) ප්‍රසම්පාදනය සහ ඉන්වෙන්ටර් පාලනය

ප්‍රසම්පාදනය ඃ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රබල පද්ධතියක් අනුගමනය කරනු ලැබේ. පහත සඳහන් ක්‍රියා පරිපාටි අනුගමනය කෙරේ.

(i) රු. 2,00,000ට වැඩි වටිනාකම් සහිත භාණ්ඩ අනුමත කරනු ලබන්නේ මිලදී ගැනීමේ කමිටුව විසිනි ;

(ii) භාණ්ඩවල වටිනාකම අනුව මිල ගණන් කැඳවීමේ/ටෙන්ඩර් ක්‍රියා පරිපාටිය අනුගමනය කරනු ලැබේ ;

(iii) අවශ්‍ය අවස්ථාවන්හි දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව ලබා ගැනේ ;

(iv) පාවිච්චි කරන දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්ගෙන්ද සැපයුම් අංශයේ නිලධාරියෙකුගෙන්ද අභ්‍යන්තර විගණකගෙන් ද සමන්විත කණ්ඩායමක් විසින් ගුණාත්මක තත්ත්වය සහතික කරනු ලැබේ.

(v) ඉන්වෙන්ටරි රෙජිස්ටරයෙහි භාණ්ඩ ඇතුළත් කොට මුදල් ගෙවීමට පෙර GRN ලබා ගැනේ.

**ඉන්වෙන්ටරි පාලනය**

(i) ලැබීම් සහ නිකුත් කිරීම් පරිගණකගත කර තිබේ.

(ii) මාසික භාණ්ඩ විශ්ලේෂණය මගින් වියදම ගණනය කරනු ලැබේ.

(iii) ගබඩා අත්තිකාරම් ගිණුම (සැපයුම්) සහ ගබඩා අත්තිකාරම් ගිණුම (නඩත්තු) නම් වූ වෙනස් වෙනස් අත්තිකාරම් ගිණුම් දෙකක් ප්‍රධාන ලෙජරයෙහි පවත්වා ගෙන යනු ලැබේ.

(iv) අතිරේක ගබඩා ලෙජර් ගිණුම්, ප්‍රධාන ලෙජර් ගිණුම සමග සසඳනු ලැබේ.

(v) එක් එක් පීඨයේ වියදම වෙන වෙනම සමීක්ෂණය කෙරේ.

(vi) තොග ශේෂය සහ එක් එක් භාණ්ඩයේ වටිනාකම ඕනෑම වේලාවක ලබා ගත හැකිය.

**ණය ගැතියෝ**

(i) ණය කටයුතු පරිගණකගත කර අයකිරීම් අප්‍රමාදව සිදු කෙරේ.
තුලනය සහ සැසඳුම් ත්‍රෛමාසිකව කරනු ලැබේ.

(ii) සැපයුම් අත්තිකාරම් කලින් කල සමීක්ෂණය කෙරෙන අතර ගෙවන ලද අත්තිකාරම් සඳහා භාණ්ඩ ලබා ගැනීමට ක්ෂණික පියවර ගනු ලැබේ.

මූල්‍යාධිකාරී විසින් සම්පාදිතයි.

12-70

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කඳුරට සංවර්ධන බැංකුව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.07.21 දින සම්මත කරන ලද යෝජනාව.

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මහනුවර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්. එම්. බී. ඩබ්. බන්දුල රත්නායක මහතා විසින් ලියා සහතික කරන ලද 2004.12.27 දිනැති අංක 9696 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම, පන්විල, කෙලින් වීදිය. අංක 234 යන ලිපිනයෙහි පදිංචි කුමාරසාමි වසන්ත කුමාර් සහ වාත්තයියා ක්‍රිෂ්ණසාමි දේවගි යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2008.06.30වැනි දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රු. එක්ලක්ෂ විසිතුන්දාස් හාරසීය හැත්තෑපහයි සත පනස් හතරක (රු. 123,475.547) ක් වූ මුදල හා එදින සිට රු. එක්ලක්ෂ දහ අටදාස් අටසිය විසි පහයි ශත පනස් හතර (රු.118,825.54) සඳහා වාර්ෂිකව 22.84% බැගින් විකිණීමේ දිනය දක්වා පොලිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 9696 මගින් උකස් කරනු ලැබුවාවූ ද, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ කෝරලේ පන්විල පිහිටි

01. අංගම්මන වත්ත සහ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතා විසින් වර්ෂ 1997 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින මැන සාදන ලද අංක 2618 දරන, පිඹුර ප්‍රකාර කැබලි අංක 03 ලෙස පෙන්නුම් කර ඇති පර්චස් නමයයි දශම අටයි අටක් (අක්. 0, රූඩ්. 0, පර්. 9.88) විශාල උතුරට : මහපාර ද, නැගෙනහිරට : කබැලි අංක 04 ද, දකුණට : අංගම්මන වත්ත වෙන්වන පැල ඉනිවැටද සහ බස්නාහිරට : පාරද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද සහ

02. ඉහත කී 1997.12.15 වැනි දින මැන සාදන ලද අංක 2618 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 02 ලෙස පෙන්නුම් කර ඇති පර්චස් එකයි දශම එකයි හතරක් (අක්. 0, රූඩ් 0, පර්. 1.14) විශාල උතුරට : මහපාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංගම්මන වත්ත වෙන්වන පැල ඉනිවැට ද, සහ බස්නාහිරට : ඇල ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුල පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඊ 745/223 හා 224 යටතේ 2004.12.29 වැනි දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධි විධාන වලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

12-152/1

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.10.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2005.11.07 දිනැති අංක 4815 දරන බැඳුම්කරය මත ණය ගිණුම සඳහා මුල් මුදල හා 2008.07.07 දින තෙක් පොළිය වශයෙන් රුපියල් අටලක්ෂ තිස්දහස් දෙසිය තිස්තුනයි ශත පනස් හතරක (රු. 8,30,233.54) මුදලක් සමඟ රුපියල් හයලක්ෂ හැටඑක් දහස් පනස් දෙකයි ශත පනස්අටක (රු. 6,61,052.58) මුදලක් මත වසරකට සියයට විස්සයි දශම හතයි පහ (20.75%) බැගින් පොළියක් ද, 2008.07.08 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, අංක M-1/1, වර්තමාන ලිපිනය මාකොළ, මාකොළ උතුර, සමාදාන මාවත, අංක 354/B හි පදිංචි හල්ලොලුව කංකානම්ගේ නිහාල් මහතා සහ ටෙක්ලා හෙන්ඩ්‍රික්ස් මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 4815 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් අටලක්ෂ තිස්දහස් දෙසිය තිස්තුනයි ශත පනස් හතරක (රු. 8,30,233.54) මුදල සමග 2008.07.08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, අලුත්කඩේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ (මාකොළ උප කාර්යාලය) මාකොළ උතුරේ පිහිටි සමාදාන මාවත, වරිපනම් අංක 65/21 දරන මිල්ලගහවත්ත හෙවත් කැකුණගහදෙණිය නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. ජී. ඩබ්. එම්. බන්දුතිලක විසින් සාදන ලද 2005 පෙබරවාරි මස 27 දිනැති අංක 10034/2005 දරන පිඹුරේ විස්තර කළ ලොට් 2බී වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1983 අප්‍රේල් මස 17 දිනැති අංක එච්/907 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 2ඒ ද, බස්නාහිරට : ලොට් 2ඒ ද, මායිම්ව එකී අංක 10034/2005 දරන පිඹුර අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි පහයි දෙකයි නවයක (හෙක්. 0.02529) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහකොළ, වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 720/61හි ලියාපදිංචි කර ඇත.

#### දෙවැනි උපලේඛනය

එකී මාකොළ උතුර පිහිටි මිල්ලගහවත්ත හෙවත් කැකුණගහදෙණිය නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1983 අප්‍රේල් මස 17 දිනැති අංක එච්/907 දරන පිඹුරේ විස්තර කළ ලොට් 10 වශයෙන් සඳහන් (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කළ) බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 2 සහ සමාදාන මාවත ද, නැගෙනහිරට : එම්. තෙන්නකෝන් සහ අනෙක් අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : ලොට් 4 සහ 3 ද, බස්නාහිරට : ලොට් 11, 02 සහ 1 ද මායිම්ව එකී අංක එච්/907 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 14.5) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 720/62හි ලියාපදිංචි කර ඇත.

ඒ. එස්. එම්. කේ. හේරත්,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අළුත්කඩේ ශාඛාව.

12-200

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.10.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2004.01.09 දිනැති අංක 2358 දරන බැඳුම්කරය මත ණය ගිණුම සඳහා මුල් මුදල හා 2008.06.24 දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිහය ලක්ෂ හැටහතර දහස් හාරසිය තිස්අටයි ශත හැටහතක (රු. 26,64,438.67) මුදලක් සමග රුපියල් දාහත් ලක්ෂ හැත්තෑපන් දහස් දෙසිය තිස්පහයි ශත හැටඅටක (රු. 17,75,235.68) මුදලක් මත වසරකට සියයට විස්සයි දශම හතයි පහ (20.75%) බැගින් පොළියක් ද, 2008.06.25 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සීදුව, අමුණ පාර, 'සේද නිවස' හි පදිංචි වැවලගේ එඩ්වර්ඩ් ප්‍රනාන්දු මහතා සහ උඩුවනගේ සිරිමා ප්‍රනාන්දු මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2358 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිහය ලක්ෂ හැටහතර දහස් හාරසිය තිස්අටයි ශත හැටහතක (රු. 26,64,438.67) මුදල සමග 2008.06.25 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව්, හි පදිංචි වෙන්දේසිකාර රංජිත සිරිවර්ධන මහානාම මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (307) අධිකාරය හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, සීදුව ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දාසියපත්තුවේ, කටුනායක - සීදුව සුළු නගර සභා සීමාවේ සීදුව දකුණේ

පිහිටි කොස්ගහ හෙවත් කොස්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. එෆ්. ප්‍රානන්දු විසින් සාදන ලද 2000.05.25 දිනැති අංක 3751/2000 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ඩබ්. එම්. ඩී. මාග්‍රට් සහ අනෙක් අයගේ ඉඩම ද, නැගෙනහිරට : එල්. එම්. සිල්වාගේ ඉඩම සහ පාර ද, දකුණට : පාර ද, බස්නාහිරට : එස්. පිටිපන සහ ඒ. පිටිපන යන අයගේ ඉඩම් ද, මායිම්ව පර්චස් පහළොවයි දශම දෙකයි දෙකක (අ. 0, රූ. 0, පර්. 15.22) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 838/180හි ලියාපදිංචි කර ඇත.

තවද, අංක 3751/2000 දරන පිඹුරේ අඩි 10ක් පළල පාර මත මාර්ග අයිතිය ද වේ.

එම්. කේ. ජී. අයි. කීර්තිලතා මහත්මිය,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
සීදූව ශාඛාව.

12-203

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2008.08.26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න මහත්මිය විසින් සහතික කරන ලද 2007.01.24 දිනැති අංක 3085 හා 3086 දරන බැඳුම්කර මත ණය ගිණුම් දෙකක් මත මුල් මුදල හා 2008.06.23 දින තෙක් පොළිය හා අනෙකුත් ගාස්තු වශයෙන් රුපියල් පනස්පන් ලක්ෂ අටදහස් තුන්සිය හතලිස් තුනයි ශත විසිඑකක් (රු. 55,08,343.21) සහ රුපියල් එක්කෝටි එක්ලක්ෂ අටදහස් තුන්සිය හැත්තෑහයයි ශත නවයක (රු. 1,01,08,376.09) මුදලක් සමග රුපියල් හතලිස් නව ලක්ෂ තිස්නවය එකසිය හතලිස් නවයයි ශත අසූහයක (රු. 49,39,149.86) ක මුදලක් සහ රුපියල් අසූහත්ලක්ෂ තිස්පන් දහස් හත්සිය හතලිස් පහයි ශත තිස් අටක (රු. 87,35,745.38) මුදලක් මත පිළිවෙලින් වසරකට සියයට විසිපහයි දශම හතරයි හතක (25.47%) සහ සියයට විසිඅටයි දශම පහ (28.5%) බැගින් පොළියක් ද, 2008.06.24 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කැළණිය, කිරිබත්ගොඩ, මහනුවර පාර, අංක 6A හි පිහිටි සීමාසහිත ඉන්දියන් පැෂන් පුද්ගලික ආයතනයෙන් සහ රාගම, කුරුකුලාව, අංක 221/ V හි පදිංචි එස්. විලියම්ස් මහත්මියගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3085 සහ 3086 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් පනස්පන් ලක්ෂ අටදහස් තුන්සිය හතලිස් තුනයි ශත විසිඑකක (රු. 55,08,343.12) සහ රුපියල් එක්කෝටි එක්ලක්ෂ අට දහස් තුන්සිය හැත්තෑහයයි ශත නවයක (රු. 1,01,08,376.09) මුදල් සමග 2008.06.24 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474හි පදිංචි ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අදිකාරි පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ (වැලිසර උප කාර්යාලය) මහර කුරුකුලාව ග්‍රාමයේ පිහිටි කුරුකුලාව පාර, දකුණේ වරිපනම් අංක 296/30 දරන පඹුරුගහවත්ත හෙවත් ලිඳමුලකොටුව නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 2000 ජූලි මස 08 දිනැති අංක 440/2000 දරන මිණුම් පිඹුරේ විස්තර කළ ලොට් V වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් T සහ U ද, නැගෙනහිරට : ලොට් R 2 ද (අඩි 15ක් පළල පාරක් සඳහා වෙන්කළ) දකුණට : කලින් වී. අගිදා සහ ගිරගෝරිස් නානායක්කාරට ද වර්තමානයේ උප බෙදුමක් කර විකුණන ලද ඉඩම ද, බස්නාහිරට : කලින් වී. අගිදා සහ ගිරිගෝරිස් නානායක්කාරට ද. වර්තමානයේ උප බෙදුමක් කර විකුණන ලද ඉඩම ද, මායිම්ව එකී අංක 440/2000 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම හයයි පහක (අ. 0, රූ. 0, පර්. 14.65) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 618/249හි ලියාපදිංචි කර ඇත. තවද, එකී අංක 440/2000 දරන පිඹුරේ විස්තර කළ ලොට් R1, R2, R3, R4 මත මාර්ග අයිතියද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

බී. එම්. ප්‍රේමරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
කොල්ලුපිටිය අධිශ්‍රේණි ශාඛාව.

12-202

---

## මහජන බැංකුව- කිරිදිවැල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2004.03.11 දිනැති අංක 9019 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ගුණතිලකගේ ගාමිණී අභයවර්ධන යන අය විසින් පැහැර ඇති බැවින් එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ පනස් අට දහස් හයසිය දහතුනයි ශත අනූ හතර (රු. 2,58,613.94) ක මුදලක් සහ 2007.12.29 වැනි දින සිට වර්ෂයකට 18.25% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද, සහ ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2007.01.12 දිනැති අංක 12049 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ගුණතිලකගේ ගාමිණී අභයවර්ධන සහ ලියනආරච්චිගේ ශ්‍රීමා රංජනී අභයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ විසිපන්දහසයි ශත තුන (රු. 4,25,000.03) ක මුදලක් සහ

2007.12.28 දින සිට වර්ෂයකට 23% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ පනස් අට දහස් හයසිය දහතුනයි ශත අනූහතර (රු. 2,58,613.94)ක මුදල හා එම මුදලට 2007.12.29 වැනි දින සිට වර්ෂයකට 18.25% බැගින් පොළිය මෙන්ම රුපියල් හාරලක්ෂ විස්පත් දහසයි ශත තුන (රු. 4,25,000.03) ක මුදල හා එම මුදලට 2007.12.28 වැනි දින සිට වර්ෂයකට 23% බැගින් පොළිය ද අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර රන්ජිත එස්. මහානාම විසින් එකී අංක 9019 හා 12049 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබොඩ පත්තුවේ, කිරිඳිවැල (පෙර දී පද්දාවල) පිහිටි, නුගගහලන්ද අත්තනගහහේන සහ කුරුඳුවත්ත නමැති ඉඩමේ බලයලත් මානක එස්. එම්. චන්ද්‍රසිරි විසින් 2004.02.27 වැනි දින මැන සකස් කරන ලද අංක 2694 දරන පිඹුරේ ලොට් අංක 81/1 දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : ලොට් අංක 82 ද, දකුණු-නැගෙනහිරට : ලොට් 105 ද, දකුණු-බස්නාහිරට : ලොට් 80 ද, උතුරු-බස්නාහිරට : ලොට් 72 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවය (අ. 0, රූ. 0, පර්. 19) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 394/87 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ මාර්ග සඳහා වෙන් කර ඇති කොටස් වල මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

12-167

---

### මහජන බැංකුව- බදුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් සහතික කරන ලද 2004.08.12 වැනි දිනැති අංක 2602 සහ 2603 දරන උකස් බැඳුම්කර දෙක සහ 2005.05.29 වැනි දිනැති අංක 3068 දරන උකස් බැඳුම්කරය යන බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම කාසිගේ දමින්ද සිල්වා සහ අමරා චන්ද්‍රලේඛා ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර අංක 2602 මත රුපියල් විසිහත් ලක්ෂ විසිහත්දහස් හයසීයයක (රු. 27,27,600) මුදලක් සහ එකී බැඳුම්කර අංක 2603 මත රුපියල් නවලක්ෂ තිස්එක්දාහසක (රු. 9,31,000) මුදලක් සහ එකී බැඳුම්කර අංක 3068 මත රුපියල් හැට ලක්ෂ විසිනමදහස් පන්සීයයක (රු. 6,029,500) මුදලක් සහ රුපියල් විසිහය ලක්ෂ තිස්හයදහස් හත්සීයක (රු. 3,636,700) මුදලක් යන මුදල් ප්‍රමාණයන් දැනට එකී මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් එකී රුපියල් විසිහත් ලක්ෂ විසිහත්දහස් හයසියයක (රු. 2,727,600) මුදලක් සහ ඒ සමඟ එකී රුපියල් විසිහත් ලක්ෂ විසිහත්දහස් හයසියයක (රු. 2,727,600) මුදල මත 2008.05.07 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම හතයි පහ (20.75%) බැගින් තවදුරටත් වූ පොළිය ද, ඒ සමග රුපියල් නවලක්ෂ තිස් එක් දාහක (රු. 9,31,000) මුදලක් සහ ඒ සමග එකී රුපියල් නව ලක්ෂ තිස් එක් දාහක (රු. 9,31,000) මුදල මත 2008.02.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් තවදුරටත් වූ පොළිය ද, ඒ සමග හැට ලක්ෂ විසිනවදහස් පන්සියයක (රු. 6,029,500) මුදල සහ ඒ සමග එකී රුපියල් හැටලක්ෂ විසිනවදහස් පන්සියයක (රු. 6,029,500) මුදල මත 2008.02.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම හතයි පහ (20.75%) බැගින් තවදුරටත් වූ පොළිය ද, ඒ සමග රුපියල් විසිහය ලක්ෂ තිස්හයදහස් හත්සියයක (රු. 2,636,700) මුදලක් සහ එකී රුපියල් විසිහය ලක්ෂ තිස්හයදහස් හත්සියයක (රු. 2,636,700) මුදල මත 2008.01.14 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයට සියයට විස්සයි දශම හතයි පහ (20.75%) බැගින් තවදුරටත් වූ පොළිය ද සමග එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු එකී මුදල් ප්‍රමාණයක් අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකරු ඩබ්. ජයලතිලක යන අය විසින් එකී අංක 2602, 2603 හා 3068 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර විසින් සහතික කරන ලද උකස් බැඳුම්කර වන 2004.08.12 වැනි දිනැති අංක 2602 සහ අංක 2603 යන අංක දරන උකස් බැඳුම්කර දෙක යටතේ උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ ගබඩාගම පිහිටි "වරකාවේවත්ත" හෙවත් "වරකාවේඅගත" (බදුල්ල අවසරලත් මිනින්දෝරු එම්. ඩබ්. ක්‍රොප්ටන් සෑදූ 1929.10.15 දිනැති අංක 173A දරන මැනුම් පිඹුරේ දක්වා ඇති කැබලි අංක 1 සහ 2 යන ඉඩම් කැබලි 1937.06.21 දිනැති පිඹුරේ කැබලි අංක ඒ සහ බී වශයෙන් සලකුණු කොට ඇත) නමැති ඉඩමේ කැබලි අංක 1 (A කැබැල්ල හැර) සහ B කැබැල්ල (අංක 2 කැබැල්ලේ නිර්ණය කරන ලද කොටසක් වේ) හි බෙදන ලද කොටසකින් යුතු කොටස් ඒකාබද්ධ කරන ලද කොටස වූ එකී ඒකාබද්ධ කරන ලද කොටසේ මායිම් උතුරට : ජුබිලි පාර (දැනට ධර්මදූත පාර) ඊසානට සහ නැගෙනහිරට : රේස්කෝස් පාර, ගිණිකොණට : කැබලි අංක 2 හෝ ඉතිරි කොටස දකුණට : සිමාසහිත ඌව කෝපි සමාගමේ ඉඩම සහ බේයිලි පාර, බස්නාහිරට : බෞද්ධ පාඨශාලාව (ධර්මදූත විද්‍යාලය) යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම හතයි තුනක (අ. 0, රූ. 2, පර්. 12.73) වපසරියෙන් යුත් ඉඩම, ගොඩනැගිලි, වැවිලි ඇතුළු සෑම සියලු දේත් සමග වේ. බදුල්ල, ධර්මදූත පාරේ, වරිපනම් අංක

14 දරන මෙම දේපළ බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A74/229 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී ඒකාබද්ධ කරණ ලද ඉඩමට අවසර ලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් සෑදූ 1982.01.12 දිනැති අංක 1827 දරන මැනුම් පිඹුරේ දැනට දක්වා ඇති පරිදි පහත දැක්වෙන පරිදි විස්තර කොට ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ පිහිටි ධර්මදූත පාරේ, වරිපනම් අංක 14 දරන කිංස් සිනමාහල සහ එහි පරිශ්‍රය වන "වරකාවේ වත්ත හෙවත් වරකාවේඅගත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටස වූ එකී ඉඩමේ මායිම් උතුරට : ධර්මදූත පාර, නැගෙනහිරට : රේස්කෝස් පාර සහ නජිදියාර්දීන් සතු වත්ත, දකුණට : මහ නගර සභා සිමෙන්ති කාණුව සහ නජිදියාර්දීන් සතු වත්ත, බස්නාහිරට : මහ නගර සභා සිමෙන්ති කාණුව යන මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම හතයි පහක (අ. 0, රූ. 1, පර්. 33.75) වපසරියෙන් යුතු ඉඩම ගොඩනැගිලි, වගාව ඇතුළු එහි පිහිටි සෑම සියලු දේත් සමග වේ. මෙය බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A90/39 යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර විසින් සහතික කරන ලද 2005.05.29 දිනැති 3068 අංකය දරන උකස් බැඳුම්කරය යටතේ උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ පිහිටි "වරකාවේවත්ත හෙවත් වරකාවේඅගත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බදුල්ලේ අවසර ලත් මිනින්දෝරු එම්. ෆායිසි ෆුවාඩ් ඉස්මයිල් යන අය විසින් 2003.09.17 වැනි දින මැන අඳින ලද අංක 656 දරන මැණුම් පිඹුර ප්‍රකාර බෙදා වෙන්කොට නිර්ණය කරන ලද කැබලි අංක 1 යනුවෙන් සලකුණු කොට ඇති මෙකී ඉඩම් කැබලි අංක 1හි මායිම්, උතුරට : සිමෙන්ති කාණුවෙන් වෙන් කරන ලද ධර්මදූත පාර සහ කැබලි අංක 2, නැගෙනහිරට : කැබලි අංක 2 සහ සිමෙන්ති කාණුවෙන් වෙන් කෙරෙන රේස්කෝස් පාර "ලංකා ඉන් " සහ නජිදියාර්දීන් සතු පරිශ්‍රය, දකුණට : "ලංකා ඉන් " සහ නිජිදියාර්දීන් සතු පරිශ්‍රය, බදුල්ල මෝටර්ස් සහ සුගතපාලගේ පරිශ්‍රය සහ සුගතපාල අයිතිවාසිකම් කියන ඉඩම බස්නාහිරට : බදුල්ල ධර්මදූත විද්‍යාලය සහ වසන ලද සිමෙන්ති කාණුවෙන් වෙන් කෙරෙන පරිශ්‍රය යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් හතරක් (අ. 0, රූ. 1, පර්. 4) වපසරියක් ඇති ඉඩම සහ එහි පිහිටි සෑම සියලු දේත් සමඟ වේ.

2. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ පිහිටි "වරකාවේවත්ත හෙවත් වරකාවේඅගත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට අවසරලත් මිනින්දෝරු එම්. ෆයිසි ෆුවාඩ් ඉස්මයිල් යන අය 2003.09.17 වැනි දින මැන සාදන ලද අංක 656 දරන මැනුම් පිඹුරට අනුව බෙදා වෙන් කර නිර්ණය කර ඇති කැබලි අංක 2 වශයෙන් සලකුණු කොට ඇති ඉඩම් කැබලි අංක 2 හි මායිම් උතුරට : සිමෙන්ති කාණුවෙන් වෙන් කෙරෙන ධර්මදූත පාර, නැගෙනහිරට : සිමෙන්ති කාණුවෙන් වෙන් කෙරෙන රේස්කොස් පාර සහ කැබලි අංක 1, දකුණට : කැබලි අංක 1, බස්නාහිරට : කැබලි අංක 1 යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) වපසරියෙන් යුතු ඉඩම සහ එහි පිහිටා ඇති සෑම සියලු දේත් සමග වේ.

පෙර කී බෙදා වෙන් කොට නිර්ණය කරන ලද ඉඩම් කැබලි දෙක යන ඌව පළාතේ, බදුල්ලේ දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමා තුළ ගබඩාගමෙහි පිහිටි "වරකාවේවෙත්ත හෙවත් වරකාවේඅගත" (බදුල්ලේ අවසර ලත් මිනින්දෝරු එම්. ඩබ්. ක්‍රොප්ටන් සෑදූ 1929.10.15 දිනැති අංක 173A මැනුම් පිඹුරේ කැබලි අංක 1 සහ 2 වශයෙන් දක්වා ඇති ඉඩම් කැබලි 1937.06.21 දිනැති පිඹුරේ කැබලි අංක A සහ B වශයෙන් සලකුණු කොට ඇත) යනුවෙන් හඳුන්වනු ලබන බෙදා වෙන් කොට ඇති කැබලි අංක 01 (කැබලි A හැර) සහ B කැබැල්ල (කැබලි අංක 2 හි නිර්ණය කරන ලද කැබැල්ලකි) යන කොටස් ඒකාබද්ධ කරණ ලද ඉඩම් කොටස වන එකී ඒකාබද්ධ කරණ ලද ඉඩම් කොටසෙහි මායිම් උතුරට : ජුබිලි පාර (දැනට ධර්මදූත පාර) ඊසාන සහ නැගෙනහිරට : රේස්කෝස් පාර ගිණිකොණට : කැබලි අංක 2හි ඉතිරි කොටස, දකුණට : සීමාසහිත ඌව කොයිෆි සමාගමට අයත් ඉඩම සහ බෙයිලි පාර, බටහිරට : බෞද්ධ පාසල (ධර්මදූත විද්‍යාලය) යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් දොළහයි දශම හතයි තුනක (අ. 0, රූ. 2, පර්. 12.73) වපසරියකින් යුතු ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි වගාව ඇතුළු සෑම සියලු දේත් සමග වේ. බදුල්ල ධර්මදූත පාරේ, වරිපනම් අංක 14 දරන මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A90/39 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කැබලි ඒකාබද්ධ කරන ලද කොටසට අවසරලත් මිනින්දෝරු එම්. ෆුවාඩ් ඉස්මයිල් සෑදූ 1982.01.12 වැනි දිනැති 1827 අංකය දරන පිඹුරේ දැනට පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ පිහිටි ධර්මදූත පාරේ වරිපනම් අංක 14 දරන කිංස් සිනමාහල සහ එම පරිශ්‍රයෙහි පිහිටි "වරකාවේවත්ත හෙවත් වරකාවේඅගත" යනුයෙන් හඳුන්වනු ලබන ඉඩම් කොසට වන එකී ඉඩමේ මායිම්, උතුරට : ධර්මදූත පාර, නැගෙනහිරට : රේස්කෝස් පාර සහ නජිදියාර්දීන්ගේ වත්ත දකුණට : නගර සභා සිමෙන්ති කාණුව සහ නජිදියාර්දීන්ගේ වත්ත බටහිරට : නගර සභා සිමෙන්ති කාණුව යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම හතයි පහක (අ. 0, රූ. 1, පර්. 33.75) වපසරියකින් යුත් ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, වගාව ද, සහිත සෑම සියලු දේත් සමග වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A90/230 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාප සහකාර සාමාන්‍යාධිකාරී,
(ඌව කලාපය).

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල

12-171

---

**මහජන බැංකුව- වරකාපොල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන
මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩබ්. එම්. ජේ. සේනාධීර මහත්මිය විසින් සහතික කරන ලද 2006.06.02 දිනැති අංක 4713 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම අස්සැල්ලලාගේ ලක්ෂ්මන් ලාල් ප්‍රියන්ත මහතා, මහදුර සූජාතා මෙන්ඩිස් හෙවත් මහදුර සූජාතා අස්සැල්ල මහත්මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට ණය මුදල සඳහා රුපියල් අසූතුන් ලක්ෂ තිස්තුන් දහසක (රු. 8,333,000) මුදලක් හා 2007.04.30 වැනි දින සිට වර්ෂයකට 15.5% බැගින්

වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 2එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී ණය මුදල සඳහා රුපියල් අසූතුන් ලක්ෂ තිස්තුන් දහසක (රු. 8,333,000) අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4713 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය - 01**

1. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, පරණකුරු කෝරළේ, මාවත පත්තුවේ, කෑගල්ල නගර සභා සීමාව තුළ වෑවලදෙනිය ගමෙහි කොළඹ-නුවර පාරේ අඟුරුවැල්ල ඔය අද්දර මූකලාන දැනට වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. කුරුකුලසූරිය මහතා විසින් 1982.10.31 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක P932 දරන පිඹුරේ ලොට් අංක 02 දරන අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් දහනවයයි (අ. 01, රූ. 03, පර්. 19) විශාල ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල්බට් සෙනෙවිරත්න මාවත නොහොත් ප්‍රසිද්ධ පාර ද, නැගෙනහිරට : ලොට් 03 සහ ඇල ද, දකුණට : ඔය ද, බස්නාහිරට : ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, පළතුරු යනාදී සියළු දේ ද වේ.

මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 473/282 දරන පිටුවේ ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් බලයලත් මානක තැනගේ 2004.05.11 වැනි දින මැන සාදන ලද 2004.05.25 දිනැති අංක 1141- 2K දරන ප්ලෑනේ ලොට් අංක A වශයෙන් පහත සඳහන් පරිදි විස්තර වේ.

වෑවලදෙනිය ගමෙහි කොළඹ-නුවර පාරේ අඟුරුවැල්ල ඔය අද්දර මූකලාන දැනට වත්ත නමැති ඉඩමට ජේ. එම්. ඩී. ටී. පැට්‍රික් රෙජිනෝල්ඩ් බලයලත් මානක තැනගේ 2004.05.11 වැනි දින මැන සාදන ලද 2004.05.25 දිනැති අංක 1141- 2K දරන ප්ලෑනේ ලොට් අංක A දරන අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහනවයයි (අ. 1, රූ. 3, පර්. 19) විශාල ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල්බට් සෙනෙවිරත්න මාවත ද, නැගෙනහිරට : 932 A දරන ප්ලෑනේ ලොට් 03 සහ ඇල ද, දකුණට : ඔය ද, බස්නාහිරට : 932 A දරන ප්ලෑනේ ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියළු දේ ද වේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය - 02**

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බෝතලේ ඉහළගම ගමෙහි පිහිටි බෙලිපිටිය එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක කේ. ඒ. ජී. අමරසිංහ මහතා විසින් 1986.05.29 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 4945 දරන පිඹුරේ ලොට් අංක බී දරන අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩමට මායිම්, උතුරට : එකී මිනින්දෝරු තැනගේ අංක 4731 දරන පිඹුරේ ලොට් ඒ ද, නැගෙනහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයිති ඉඩම ද, දකුණට : ලොට් 05 ද, බස්නාහිරට : ගම් සභා පාර ද යන මායිම් තුළ ඇති ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේද වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක F 212/15 A දරන පිටුවේ ලියාපදිංචි වී ඇත. ඉහත කී ඉඩමට ජේ. එම්. ඩී. පැට්‍රික් රෙජිනෝල්ඩ් බලයලත් මානක තැන විසින් 2005.09.26 වැනි දින මැන සාදන ලද 2005.09.29 දිනැති අංක 1725- 2 K ලොට් 01 දරන අක්කර එකක් (අ. 1, රූ. 0, පර්. 0) විශාල ඉඩම් කොටසට මායිම්, උතුරට : බැබිලපිටිය එස්ටේට් (කේ. ඒ. ජී. අමරසිංහ මහතාගේ පිඹුරු අංක 4731 හි ලොට් අංක A) ද, නැගෙනහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයිති බැබිලපිටිය එස්ටේට් ද , දකුණට : බැබිලපිටිය එස්ටේට් කොටසක්, P P 2792, ලොට් 05 ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද යන මායිම් තුළ ඇති ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කෑගල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්ලාය,
කෑගල්ල

12-170

---

**මහජන බැංකුව- රඹුක්කන ශාඛාව**

**1980 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව**

1986 අංක 32 දරන පනතේ සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29 D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩබ්. එම්. ජේ. සේනාධීර මහත්මිය විසින් සහතික කරන ලද 2006.05.24 දිනැති අංක 4681 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම, ජයසූරියගේ අනෝමා වසන්ති කුමාරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට ණය මුදල සඳහා රුපියල් හයලක්ෂ දහනවදහස් හත්සිය විසිහයයි ශත විසි අටක (රු. 6,19,726.28) මුදලක් හා 2007.01.27 වැනි දින සිට වර්ෂයකට 10% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබ ඇත්නම් ඒවා අඩුව එකී ණය මුදල සඳහා රුපියල් හයලක්ෂ දහනවදහස් හත්සිය විසි හයයි ශත විසි අට (රු. 6,19,726.28) අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4681 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණීය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිණිගොඩ කෝරළේ, වල්ගම් පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාව තුළ දැලිවෙල ගමෙහි පිහිටි බෙල්ගොඩ වත්ත කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. රත්නායක මහතා විසින් 2005.08.02 දින මැන සාදන ලද අංක 3904 දරන පිඹුරේ ලොට් අංක 01 දරන රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩමට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : ප්‍රවේශ මාර්ගය ද, දකුණට : යටිහෙල්පල්ල වත්ත ද, බස්නාහිරට : යටිහෙල්පල්ල වත්ත ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ ඇති ගොඩනැගිලි, ගසකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

මෙම දේපළ කෑගල්ල ඉඩම් ලියාපිදංචි කිරීමේ කාර්යාලයේ අංක බී 473/61 දරන පතක්‍රරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
කෑගල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්ලාය,
කෑගල්ල

12-169

---

### මහජන බැංකුව-ගාල්ල මහවීදිය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතේ සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගාල්ල නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2006.9.11 වැනි දින සහතික කරන ලද අංක 870 සහ 871 දරන උකස්කර ප්‍රකාර ගෙවීම්, නිශාන්ත චන්ද්‍රන ධර්මසිරි අරුමප්පෙරුම යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහතුන් ලක්ෂ තිස් දෙදහස් හත්සිය අනූහතයි ශත දහහතර (රු. 13,32,797.14)ක් සහ රුපියල් ලක්ෂ විස්ස (රු. 20,00,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.05.31 වැනි දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් දහතුන් ලක්ෂ තිස් දෙදහස් හත්සිය අනූහතයි ශත දාහතර (රු. 13,32,797.14)ක මුදලක් සහ 2008.07.01 වැනි දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් ලක්ෂ විස්ස (රු. 20,00,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දහතුන් ලක්ෂ තිස් දෙදහස් හත්සිය අනූහතයි ශත දාහතර (රු. 13,32,797.14)ක සහ රුපියල් ලක්ෂ විස්ස (රු. 20,00,000) ක් මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 870 සහ 871 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

(1) දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, මීපෙ පිහිටි අඹගේනවත්තබැද්ද හෝ පොකුලුකන්ද (T. P. 283008) සහ අමුවෙලහේන (T. P. 280775 හි කොටසක්) නැමති ඉඩමේ ඒ දරන කැබැල්ල බෙදූ ඒ1 දරන ඉඩම් කැබැල්ලට කේ. ජී. සමරසේකර බලයලත් මිනින්දෝරු මහතාගේ 2002.10.26 දිනැති අංක 691 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ගම්මුන්ට අයත් ඉඩම ද, නැගෙනහිරට : මෙම ඉඩමේම අංක බී දරන කැබැල්ල සහ මෙම ඉඩමේ ඒ3 දරන කැබැල්ල ද, දකුණට : පාර සඳහා වෙන්කල ඒ4 දරන කැබැල්ල (ප්‍රාදේශීය සභා) සහ මෙම ඉඩමේම ඒ3 දරන කැබැල්ල ද, බස්නාහිරට : ඒ2 දරන කැබැල්ල (පාර) ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්දෙකක් (අ. 0, රූ. 0, පර්. 32) විශාල ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 858/207ඒ යටතේ ලියාපදිංචි කර ඇත.

(2) ඉහත කී අඹගේනවත්තබැද්ද හෝ පොකුලුකන්ද (T. P. 283008) සහ අමුවෙලහේන (T. P. 280775) හි කොටසක්) නමැති ඉඩමේ ඒ දරන කැබැල්ල බෙදූ ඒ6 දරන ඉඩම් කැබැල්ලට කේ. ජී. සමරසේකර බලයලත් මිනින්දෝරු මහතාගේ 2002.10.26 දිනැති අංක 691 දරන පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක බී, ඒ5 සහ ඒ8 දරන කැබලි සහ පාර සඳහා ලකුණු කළ ඒ4 (ප්‍රාදේශීය සභා) දරන කැබලි ද, නැගෙනහිරට : මෙම ඉඩමේම අංක බී දරන කැබැල්ල සහ ඒ7, ඒ8, ඒ9, සහ ඒ5 දරන කැබලි සහ 9205 දරන මුල් පිඹුරෙහි 1337 සහ 1332 දරන කැබලි ද, දකුණට : 9205 දරන මුල් පිඹුරෙහි 1337 සහ 1332 දරන කැබලි, වරිපනම් අංක 170023 සහ මෙම ඉඩමේම අංක ඒ7 සහ ඒ9 දරන කැබලි ද, බස්නාහිරට : රජයට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි අක්කර තුනයි රූඩ් එකයි පර්චස් තිස්අටයි දශම පහක් (අ. 3, රූ. 1, පර්. 38.50) විශාල ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දේද වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 858/208 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්ලාය,
අංක 22, පහල ඩික්සන් පාර,
ගාල්ල.

12-168

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස්-ජීපී/02/1955/එස්ඕ1/339.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.08.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. වේයන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. එන්. පී. විතාන විසින් සහතික කරන ලද 2003.11.24 දින හා අංක 5513 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වේයන්ගොඩ පදිංචි අබේසේකර මෙරෙන්චිගේ ප්‍රේමදාස රාජු අජිත කුමාර හෙවත් අබේසේකර මෙරෙන්චිගේ ප්‍රේමදාස රාජු අජිත් කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.08.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හතලිස් දෙදහස් තුන්සිය හැට හයයි ශත

අනුව (රු. 1,42,366.90) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5513 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් අටයි ශත හැත්තෑපහක් (රු. 48.75) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව්හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ, විතානමුල්ල සහ මැදගම්පිටිය ග්‍රාමයේ පිහිටි එඩ්වර්ඩ් ඇන්කර් හෙවත් ඇන්කර්වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් 2002.12.31 දින මැන සාදන ලද අංක 4345 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 15 ලෙස දෙක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16.50 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියළු දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 නොවැම්බර් මස, 21 වැනි දින,
අංක 269,
ගාලු පාර,
කොළඹ 03.

12-188/3

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : පීජී/02/1431/කේ2/494.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.05.03 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩබ්. එම්. ඒ. වනසිංහ විසින් සහතික කරන ලද 2003.02.01 දින හා අංක 136 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රදාවාන පදිංචි ලියනගේ සෝමචන්ද්‍ර සහ එගොඩවත්තේ හීනටි පොනේගෙදර සීලවතී මැණිකේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.03.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ දහඅටදහස් නවසිය පනහයි ශත පනස් එකයි (රු. 2,18,950.51)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 136 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් හැත්තෑ දෙකයි ශත නවය (රු. 72.09) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාව තුළ, වැකේ උප කාර්යාලයට අයත් රදාවාන පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. නන්දසේන විසින් සකසන ලද 2001.07.09 දින සහ අංක 2527 දරන මිනුම් පිඹුරේ කැබැලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01, එකයි, පර්චස් දොලහයි දශම නවයයි බින්දුවයි (අ0,රූ.1, පර්.12.90) ක් වූ බෙදා වෙන් කල බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

තවද එකී, 2527 දරන පිඹුරේ සඳහන් අඩි 12 ක් පළල මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 නොවැම්බර් මස, 21 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-188/2

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 9/70239/ඉසඩ්9/698.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.09.29 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. මාතර ප්‍රසිද්ධ නොතාරිස් සී. ඩබ්. ගුණරත්න විසින් සහතික කරන ලද 2000.06.25 දින හා අංක 17047 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙවිනුවර පදිංචි කරන්දෙනිය මහදුරාගේ නන්දසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ තිස් අටදහස් හයසිය දහතුනයි ශත හැට දෙකක (රු. 5,38,613.62) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 17047 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය හැටපහයි ශත හැට දෙකක (රු. 265.62) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්.ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර වැල්ලබඩ ප්‍රාදේශීය සභා සීමාවේ කපුගම පිහිටි මහවත්ත නොහොත් කෝන්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ජේ. සමරපාල විසින් බෙදා වෙන් කර සකසන ලද 1998.03.04 සහ 1998.02.25 දිනසහ අංක 1013 දරන මිනුම්පති පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 17.35 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 559/101 යටතේ ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 නොවැම්බර් මස, 21 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-188/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : එස්-1/46872/එස්ඕ1/504.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.08.27 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කේ. ඩී. ජේ. වරාගොඩ විසින් සහතික කරන ලද 2004.03.07 දින හා අංක 2872 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මුල්ලේරියාව පදිංචි මලිගස්පේ කෝරලගේ සමන් ප්‍රදීප ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.08.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හයලක්ෂ නවදහස් තිහයි ශත පනස් හය (රු. 6,09,030,56)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2872 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය අටයි ශත පනස් හතක (රු. 208.57) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල සීමාව තුළ මුල්ලේරියාව, හිඹුටාන පිහිටි කිරිපෙල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සකසන ලද 1991.11.25 දිනැති හා අංක 1862 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 13 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 9.50ක් වූ බෙදා වෙන් කරන ලද බිම්කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

පිඹුරු අංක 1862 කොළඹ ඉඩම්ලියාපදිංචි කාර්යාලයේ අංක එල්/63/215 හි ලියාපදිංචි කර ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 නොවැම්බර් මස, 21 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

12-188/4

---

### කඳුරට සංවර්ධන බැංකුව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 (ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.02 වැනි දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මහනුවර නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ටී. කුමාරි කරල්ලියද්ද මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2007.04.27 දිනැති අංක 7400 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම තෙල්දෙණිය, මහියංගන පාර, හපුගොඩ හාඩ්වෙයාර් යන ලිපිනයෙහි පදිංචි හපුගොඩගේ ලක්ෂ්මන් චමින්ද හපුගොඩ යන අය විසිල් පැහැර හැර ඇති හෙයින් 2008.07.31 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් හයලක්ෂ අනූඅටදහස් පන්සිය දහයයි ශත අනූහයක් (රු. 6,98,510.96) ක් වූ මුදල හා එදින සිට රුපියල් හයලක්ෂ පනස් දහසක් (රු. 6,50,000) සඳහා වාර්ෂිකව 27.18% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතු හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 7400 මගින් උකස් කරනු ලැබුවා වූ ද, මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර දැනට මැද දුම්බර පලිස් පත්තුව නැගෙනහිර කෝරළේ උඩවෙල ගමෙහි පිහිටි අමුනේ හේන හෙවත් අබරංසිඤ්ඤෝ ගේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. ඩී. බී. වැත්තෑව මහතා විසින් වර්ෂ 1986ක් වූ නොවැම්බර් මස 11 වැනි දින මැන සාදන ලද අංක 558 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 දරන, උතුරට : කරල්ලියද්දේ සිට

රංගල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : කැබලි අංක 02 දරන කොටස ද, දකුණට : ගම්සභා පාර ද, බස්නාහිරට : සමරකෝන්ගේ ඉඩම මායිම් වන කම්බි වැට ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එස් 153/58 යටතේ 2007.04.27 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී,

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

12-152/3

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවට් බෑන්කිං යුනිට් ශාඛාව**
**2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 9957-00330667-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අගෝස්තු මස 07 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පී. එල්. සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියා පදිංචි කරන ලදී). ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. ඉදිගහවෙල විසින් සහතික කරන ලද 2006 ජූලි මස 31 වැනි දිනැති අංක 101 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙහිවල පදිංචි නිමලේන්ද්‍රන් රගවාන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නව කෝටි විසිපන්ලක්ෂ අසූහත්දහස් පන්සිය හැට නවයයි ශත දාහතරක (රු. 9,25,87,569.14) මුදලක් 2007 නොවැම්බර් මස 20 වැනි දින වන විට සෙලාන් බැංකුව පී. එල්. සී. වෙතට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 9,25,87,569.14 මුදල ද, 2007 නොවැම්බර් මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 101 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පී. එල්. සී. වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකු පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල-බත්තරමුල්ල ප්‍රාදේශීය සභා ඒකක සීමාව තුළ තලංගම උතුර කොස්වත්ත පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 2005 මැයි මස 04 දිනැති අංක 1851ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොටකිඹුලාවත්ත ඕවිට සහ අස්වැද්දුම කුඹුර සහ පලඳයා කුඹුර නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ දැන් කඩුවෙල පාර වරිපනම් අංක 246/ඒ දරන ලොට් 1ඒ1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : කඩුවෙල පාර වරිපනම් අංක 171 දරන පරිශ්‍රය සහ පී. ඩී. මාෂල් විසින් හිමිකම් කියනු ලබන කුඹුර ද, ගිණිකොණට : පී. ඩී. මාෂල් හිමිකම් කියනු ලබන කුඹුර සහ අංක 2745 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 2 ද, නිරිතට : කඩුවෙල පාර වරිපනම් අංක 171/1 දරන ඩබ්ලිව්. හෙට්ටිආරච්චි විසින් හිමිකම් කියනු ලබන ඉඩම (අංක 2029 දරන සැලැස්මේ සඳහන් ලොට් 2) සහ වයඹට : කඩුවෙල පාර වරිපනම් අංක 171/1 දරන පරිශ්‍රය (අංක 2029 දරන සැලැස්මේ සඳහන් ලොට් 2) සහ කඩුවෙල පාර යන මායිම් තුළ එකී අංක 1851ඒ දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් තිස් හතක් (අ. 0, රූ. 1, පර්. 37) නොහොත් හෙක්ටයාර් 0.19476 විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව පී 1626/147හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

12-156

---

**සෙලාන් බැංකුව පීඑල්සී - හලාවත ශාඛාව**
**(2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියාපදිංචි කරන ලදී)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0150-00052638-001.

සෙලාන් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ජනවාරි මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ

8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මතකර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පී. එල්. සී නමට ලියන ලද (2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව්9 යටතේ ලියා පදිංචි කරන ලදී). ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්තු විසින් සහතික කරන ලද 1996 ජනවාරි මස 26 දිනැති අංක 2832 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පනිරුන්දෑව හි එස් ඇන්ඩ් එස් සප්ලයර්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන වික්‍රමනායක පතිරුන්නැහැලාගේ ජයන්ත සිසිර කුමාර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑ එක් දහස් එකසිය අනූපහයි ශත දහ අටක (රු. 71,195.18) මුදලක් 2007 මාර්තු මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 71,195.81 මුදල ද, 2007 අප්‍රේල් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2832 බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පී. එල්. සී. වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකු පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ උතුරු පිටිගල් කෝරළේ යාගම් පත්තුවේ බිංගිරිය පිහිටි මිනුම්පති ඒ. එච්. පී. ඩෝසන් විසින් සාදන ලද 1927.03.03 වැනි දිනැති අංක 383330 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මල්ගහවත්ත නමැති බෙදූ ඉඩමට මායිම්, උතුරට : හේරත්හාමි විදානෙරාල සහ තවත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඖෂධහාමි සහ තවත් අයට අයිති කුඹුර ද, දකුණට : සිංගප්පු සහ තවත් අයට අයිති ඉඩම සහ බස්නාහිරට : සිංගප්පුගේ ඉඩම ද යන මායිම් තුළ රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම. මෙය දැන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1995.07.15 දිනැති අංක 1160 දරන සැලැස්මේ ලොට් 1 වශයෙන් පෙන්නුම් කරනු ලබන අතර එකී අංක 1160 දරන සැලැස්මේ සඳහන් ලොට් 1ට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1995.07.15 දිනැති අංක 1159 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ලකුණු කල පාර සඳහා වෙන් කිරීම සහ ආර්. ආර්. එම්. වාල්ස් ජයරත්න ගේ ඉඩම ද, නැගෙනහිරට : ඖෂධහාමි සහ තවත් අයට අයිති කුඹුර ද, දකුණට : ඩබ්ලිව්. පී. ජේ. සිසිර කුමාරගේ ඉඩම සහ බස්නාහිරට : ආර්. ආර්. එම්. චන්ද්‍රාවතීගේ ඉඩම සහ ආර්. ආර්. එම්. වාල්ස් ජයරත්නගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් තිහ් පහක් (අ. 0. රූ. 0, පර්. 35) විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම සහ එකී අංක 1159 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම පාවිච්චියට ගැනීමේ අයිතිය සමග. මෙය ආර් 13/191හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,<br>
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

12-158

### මහජන බැංකුව-මාවනැල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාවනැල්ල, නුවරපාර, අංක 315හි තම ලියාපදිංචි කාර්යාලය පිහිටි 1982 අංක 17 දරන සමාගම් පනත (දැනට 2007 අංක 07 දරන සමාගම් පනත) යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වූ රන්සිරි කනෆෙක්ෂනරි (පුද්ගලික) සමාගම (ලියාපදිංචි අංක N (PVS) 18184) ණයකරු වශයෙන් ද, එකී සමාගමේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ වූ ගල්හේන ගමගේ රත්නසිරි යන අය උකස්කරු වශයෙන් ද අත්සන් තබන ලද කෑගල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් රොමෙල් විජේවර්ධන මහතා විසින් 2007.03.19 දින ලියා සහතික කරන ලද අංක 11082 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම, එකී රත්සිරි කන්ෆෙක්ෂනරි (පුද්ගලික) සමාගම විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හැටඅට ලක්ෂ අසූ එක් දහස් නවසිය පනස් හයයි ශත තිස් නවයක (රු. 68,81,965.39) මුදලක් එකී බැංකුව වෙත දැනට අයවීමට ඇති හෙයින් ද, එකී රුපියල් හැටඅට ලක්ෂ අසූඑ ක් දහස් නවසිය පනස් හයයි ශත තිස් නවයක (රු. 68,81,956.39) මුදල සහ එකී මුදල මත 2007.07.06 දින සිට වර්ෂයකට 30% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය ද, වෙන්දේසි ගාස්තු සහ ඉහත කී මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය හැකි මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් අංක 11082 උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරළේ මැද පත්තුවේ, මාවනැල්ල නගර සීමාව තුළ බෙලිගම්මන මෙඩේරිගම පිහිටා තිබෙන පාඩපොතකුඹුර නමැති ඉඩමට බලයලත් මානක ඩබ්.එම්.එල්. ආර්. වීරසිංහ මහතා විසින් 2005.11.19 දින මැන බෙදා වෙන් කරන ලද අංක 930 පිඹුරේ කැබලි අංක 1 දරන රූඩ් දෙකයි පර්චස් දහයක (අක්. 00, රූ. 02, පර්. 10) විශාල ඉඩමට මායිම්, උතුරට : ඇල සහ කොළඹ නුවර පාර ද ; නැගෙනහිරට : අංක 3572 දරන පිඹුරු පතේ පෙන්නුම් කෙරෙන අංක 15 දරන කැබැල්ල ; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ 3706 පිඹුරේ ලොට් 1 ද අංක 3572 දරන පිඹුරු පතේ පෙන්නුම් කරන කැබලි අංක 4, 5,6, 7 හා 8 හා මෙම ඉඩමේ ඉතිරි කොටස (අංක 3572 පිඹුරු පතේ පෙන්නුම් කරන කැබලි අංක 1, 2, 3 සහ 3830 පිඹුරේ ලොට් අංක 01) ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද අංක 3830 දරන පිඹුරු පතේ පෙන්නුම් කරන කැබලි අංක 01 ද යන මායිම් තුළ ඇති ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, ගසකොළ, පළතුරු ආදී සෑම සියලු දේද වේ. මෙම ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C794/64 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,<br>
කෑගල්ල.

මහජන බැංකුව,<br>
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,<br>
කෑගල්ල.

12 -161

මහජන බැංකුව- ගොඩකවෙල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.05.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් සුනිල් ගුණසේන ලියනගේ මහතා විසින් සහතික කරන ලද 1998.12.16 දිනැති අංක 2429 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම, ගොඩකවෙල කංකානමලාගේ උපාලි චන්ද්‍රසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ පනස් අටදහස් පන්සියයක මුදලක් (රු. 3,58,500) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.12.29 දින සිට වර්ෂයකට 27% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ පනස් අටදහස් පන්සියයක මුදලක් (රු. 3,58,500) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ විසින් එකී අංක 2429 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපල පිළිබඳ විස්තර

සබරගමුව පළාතේ - රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කොරළේ, තඹගමු පත්තුවේ, කොස්නාතොට පිහිටි "කොට්ටිඹුල්වලයාගේ වත්තේ බස්නාහිර කැබැල්ල" යනුවෙන් හඳුන්වනු ලබන උතුරට : මහ පාර ද, නැගෙනහිරට : කොට්ටිඹුල්වලයගේ වත්තෙ කොටසක් වෙන්වන පැලඉනි වැට ද, දකුණට : මද්දුම හාමිගේ කැබැල්ල ද, බස්නාහිරට : බංගලාවත්ත යන මායිම් තුළ පිහිටි කුරක්කන් සේරු 1 1/2 ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියළුම දේද වේ. මෙය අවසරලත් මානක කේ. ඒ. කේ. එල්. එදිරිසිංහ මහතා විසින් 1998.03.14 දින මැන සකස්කරන ලද අංක 686 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති උතුරට : ප්‍රධාන මාර්ගය ද ; නැගෙනහිරට: අවසාන ගම් පිඹුරු 695 හි අංක 232 දරන කැබැල්ලද ; දකුණට සහ බස්නාහිරට : අවසාන ගම් පිඹුරු 695 හි අංක 1261 දරන කැබැල්ල යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් තුනක් (අක්. 00, රූ. 01, පර්. 03) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ආදී සියළුම දේද වේ. එසේම මෙම ඉඩම මිනුම්පතිගේ අවසාන ගම් පිඹුරු 695 හි කැබලි අංක 231 ලෙස ද දක්වා ඇත.

මෙම ඉඩම දැනට රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ්. 319/91 පත්තිරු යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
රත්නපුර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය, රත්නපුර

12-165

මහජන බැංකුව- බත්තරමුල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29ඩී දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.06.27 වැනි දින පැවැති රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී.කේ. කේ. වැලිකුඹුර මිය විසින් සහතික කරන ලද 2006.05.26 දිනැති අංක 1199 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වන්නිආරච්චිගේ හරේෂ් පද්ම කුමාර මයා., බටගල්ලේ ගෙදර චන්ද්‍රිකා උත්පලවර්ණ මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ හයදහස් හයසිය තිස් එකයි ශත පහක (රු. 2,06,631.05) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.02.06 දින සිට වර්ෂයකට සියයට දහසයයි දශම පහ බැගින් (16.5%) හා රුපියල් දෙලක්ෂ හයදහස් හයසිය තිස් එකයි ශත පහක (රු. 2,06,631.05) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ හයදහස් හයසිය තිස් එකයි ශත පහක (රු. 2,06,631.05) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1199 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ බත්තරමුල්ල තලංගම ඒකකය තුළ දකුණු තලංගම රොබට් ගුණවර්ධන මාවතේ හෙවත් තොරාඹේ පාරේ උදයපුර පිහිටි පී. ඩබ්. පතිරණ, බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1654 සහ 1995 ඔක්තෝබර් මස 02 දින දරන ප්ලෑනයෙන් බෙදා වෙන් කළ එකී පෙලෙන්ගහවත්ත අංක 1 දරන කැබෙල්ල කියන උතුරට : මෙම ඉඩමේ ජී අක්ෂරය දරන කැබෙල්ල ද ; නැගෙනහිරට : එච් 1 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ද ; දකුණට : අංක 2 දරන කැබෙල්ල ද ; බස්නාහිරට: බුන්වල පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.35) විශාල ඉඩම සහ එහි තුල පිහිටි නිවස ඇතුළු ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියළු දේ ද වේ.

*අඩි 5ක් පළල මාර්ග අයිතිය සඳහා*.- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, බත්තරමුල්ල තලංගම ඒකකය තුළ දකුණු තලංගම රොබට් ගුණවර්ධන මාවතේ හෙවත් තොරාඹේ පාරේ උදයපුර පිහිටි පී. ඩබ්. පතිරණ බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 1654 සහ 1995 ඔක්තෝබර් මස 02 දිනත් දරන ප්ලෑනයෙන් බෙදා වෙන් කළ එකී පෙලෙන්ගහවත්ත අංක 2 දරන කැබෙල්ල කියන, උතුරට : අංක 1 දරන කැබෙල්ල ද, නැගෙනහිරට : එච් 1 දරන කැබෙල්ලේ ඉතිරි කොටස ද, දකුණට : මෙම ඉඩමේම අයි අක්ෂරය ද දරන කැබැල්ල ද, බස්නාහිරට : බුන්වල පාර ද යන මෙකී මායිම් තුල පිහිටි පර්චස් දශම හත (අ, 0, රූ. 0, පර්. 0.7) ක් හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි බින්දුවයි එකයි අටක (හෙ. 0.0018)ක් විශාල බිම් තීරයේ පොදු මාර්ග අයිතිය ද වේ.

මෙම උකස්කරය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, අංක G 1306/86, 87 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී.
බටහිර කළාප II.

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත,
මහජන බැංකුව,
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

12-173

---

### මහජන බැංකුව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනා සම්මතය 2008.03.31 වැනි දින පැවැති ඔවුන්ගේ රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒකනායක මිය විසින් සහතික කරන ලද අංක 4120 සහ 2003 අගෝස්තු 01 වැනි දින දරන උකස්කරය මත ගෙවිය යුතු ගෙවීම් මාර්කෝ ඉන්ටර්නැෂනල් හි අයිතිකරු වන වත්තිපුරගේ පාස්ල් මංජුල සේනාරත්න මයා විසින් පැහැර හැර ඇති බැවින් ද, දැන් රුපියල් හැට හතර ලක්ෂ පනස් දෙදහස් තුන්සිය පනස් පහයි ශත පනස් හතක (රු. 64,52,355.57) මුදලක් එකී බැඳුම්කරය මත පොළිය ද සමඟ මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත.

එකී රුපියල් හැට හතර ලක්ෂ පනස් දෙහස් තුන්සිය පනස් පහයි ශත පනස් හත (රු. 64,52,355.57) ක මුදලක් සහ රුපියල් හැටහතර ලක්ෂ පනස් දෙදහස් තුන්සිය පනස් පහයි ශත පනස් හත 2004 මැයි මස 01 දින සිට විකුණුම් දිනය දක්වා වසරකට 22%ක (විසි දෙකක) අනුප්‍රමාණයට තවදුරටත් පොළිය ද, විකුණුම් පිරිවැය හා වෙනත් ගාස්තු ද සහ එකී මහජන බැංකු පනතේ 29(එල්) වගන්තිය යටතේ අයකරගත හැකි මුදල් සමඟ, එදින තෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් ඇත්නම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා එකී අංක 4120 දරන උකස් බැඳුම්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම මහතුන් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ කැලණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ හුණුපිටිය ගමේ පිහිටි වරිපනම් අංක 07 දරන ගෝඨාභය මාවතේ පිහිටි දෙල්ගහවලකඩහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩබ්. ඩී. එස්. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 4738 හා 1999.09.26 දින දරන පිඹුරේ නිරූපණය කරන ලොට් 'F' දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඩයස්ගේ ඉඩම ද ; නැගෙනහිරට : ඩයස්ගේ ඉඩම ද ; දකුණට : අංක 3946 දරන පිඹුරේ ලොට් ඩී සහ සී සහ අංක 2946/ඒ දරන පිඹුරේ ලොට් බී සහ බස්නාහිරට : ගෝඨාභය මාවත ද මායිම් වූ පර්චස් විසිඑකයි දශම දෙකයි පහක් ( අ.0, රූ. 0, පර්. 21.25) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ අන් සියලු දේද යන මෙකී දේපළ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 501/277 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමනාකරු,
(ආයතනික ණය - 02).

මහජන බැංකුව,
ආයතනික බැංකු අංශය,
අංක 35, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

12 -166

---

### මහජන බැංකුව - ලුණුගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2008.08.05 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ජී. කේ. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද 2008.03.05 දිනැති අංක 287 දරන උකස්කරය, බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද 2008.03.09 දිනැති අංක 3982 සහ 2006.10.13 දිනැති අංක 4790 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් රත්නායක මුදියන්සේලාගේ නිමල් සෙනෙවිරත්න නොහොත් රත්නායක මුදියන්සේලාගේ සෙනෙවිරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී අංක 287 දරන උකස්කරය යටතේ දැනට රුපියල් පන්ලක්ෂ අසූ දහස (රු. 5,80,000)ක මුදලක් සහ රුපියල් පහළොස් ලක්ෂ තිස් දහස (රු. 15,30,000) ක මුදලක් සහ රුපියල් දහතුන් ලක්ෂ අසූ දහස (රු. 13,80,000) ක මුදලක් හා රුපියල් දහනම ලක්ෂ අසූ හතර දහස් හත්සිය නමයයි ශත අසූ හතර (රු. 19,84,709.84) ක මුදලක් ද එකී අංක 3982 දරන උකස්කරය යටතේ රුපියල් දාහතර ලක්ෂ තිස් එක් දහස් පන්සිය තිස්හතර (රු. 14,31,534) ක මුදලක් ද, එකී අංක 4790 දරන උකස්කරය යටතේ රුපියල් පහළොස් ලක්ෂය (රු. 15,00,000) ක මුදලක් ද, මහජන බැංකුවට ගෙවීමට ඉතිරිව ඇති බැවින් ද, එකී රුපියල් පන්ලක්ෂ අසූ දහස (රු. 5,80,000) ක් සහ එකී රුපියල් පහළොස් ලක්ෂ තිස් දහස (රු. 15,30,000) සහ එකී රුපියල් දහතුන් ලක්ෂ අසූ දහස (රු. 13,80,000) ක මුදල සහ එකී රුපියල් දහනම ලක්ෂ අනූ හතර දහස් හත්සිය නමයයි ශත අසූ හතර (රු. 19,94,709.84) ය යන මුදල් සඳහා 2008.01.10 දින සිට සියයට විසි හයක (26%) බැගින් වාර්ෂික පොලිය ද, එකී රුපියල් දාහතර ලක්ෂ තිස්එක් දහස් පන්සිය තිස්හතර (රු. 14,31,534) ක මුදලක් සඳහා 2007.10.10 දින සිට සියයට විසිතුන (23%) බැගින් වාර්ෂික පොලිය ද එකී රුපියල් පහළොස් ලක්ෂය (රු. 15,00,000) ක් සඳහා 2007.10.31 දි සිට සියයට විසිතුනක (23%)

බැගින් වාර්ෂි පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය ද, මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් ද, ගාස්තු ද, සමඟ අනතුරුව යම්කිසි ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකරගෙන එකී රුපියල් පන් ලක්ෂ අසූදහස (රු. 5,80,000) මුදල හා රුපියල් පහලොස් ලක්ෂ තිස් දහසක (රු. 15,30,000) ක මුදල හා රුපියල් දහතුන් ලක්ෂ අසූ දහස (රු. 13,80,000) ක මුදල සහ රුපියල් දහනම ලක්ෂ අනූ හතර දහස් හත්සිය නමයයි ශත අසූ හතර (රු. 19,94,709.84) ක මුදල සහ රුපියල් දාහතර ලක්ෂ තිස් එක් දහස් පන්සිය තිස් හතර (රු. 14,31,534) ක මුදල සහ රුපියල් පහලොස් ලක්ෂය (රු. 15,00,000)ක් යන මුදල් අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඩබ්ලිව්. ජයතිලක විසින් එකී අංක 287, 3982 හා 4790 දරන උකස්කර යටතේ උකස්කර ඇති දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

මෙම ඉඩම බදුල්ල දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ පී. 22/284 දරන පත් ඉරුවේ ලියාපදිංචිව ඇති ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර කොටසේ, පට්ටිපොල කෝරළේ, අත්තනගොල්ල ගම පිහිටි, 'බෝගහගොඩවත්ත සහ බෝගහගොඩහේන' නමැති බදුල්ල දිසා අධිකරණ බෙදුම් නඩු අංක 6397 හි ගොනු කරන ලද පිඹුර ප්‍රකාර ඉඩමේ ලොට් 1, 2, 3, 11, 13 සහ 14 දරන කොටස්වලින් සැදුන ඉඩම් කොටසට මායිම්, උතුරට : ඇල, ගල්වැට, ටී. පී. 194888 හි ලොට් 5,9,7,8, 6 සහ 10 සහ බෝගහගොඩ හේන ද ; නැගෙනහිරට: ගම්වැසියන් හිමිකම් කියන ඉඩම් සහ ඇල ද ; දකුණට : ඇල සහ බස්නාහිරට : ඇල, කුඹුර, ගල්වැට ඇල ද යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර දහයයි පර්චස් පහ (අක්. 10, රූ.00, පර්. 05) ක් විශාල ඉඩම හා එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් වේ.

මෙම ඉඩම මෑතක දී කරන ලද මිණුමකට අනුව බලයලත් මිනින්දෝරු එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර මහතා විසින් මැන සාදන ලද 1982.09.05 හා අංක 456 දරන පිඹුරුපතේ ලොට් 01 වශයෙන් සලකුණු කර ඇති අතර, පහත පරිදි විස්තර කෙරේ.

ඉහත කී බදුල්ල දිස්ත්‍රික්කයේ, පස්සර කොටසේ, පට්ටිපොල කෝරළේ, ලුණුගල සුළු නගර සභා සීමාව තුළ අත්තනගොල්ල ගම පිහිටි 'බෝගහගොඩවත්ත සහ බෝගහගොඩහේන' නමැති උතුරට: පැල ඉනි වැට, ගල් වැට සහ සුළු නගර සභා (ටී. සී. පාර) පාර ද ; නැගෙනහිරට : පැල ඉනි වැට සහ ගල් වැට ද ; දකුණට: ඇල වඩාත් නිවැරදි ලෙස ඇල සහ සුළු නගර සභා ( ටී. සී. පාර) පාර ද ; බස්නාහිරට : ඇල සහ පැල ඉනි වැට ද, යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර නමයයි, රූඩ් තුනයි, පර්චස් තිස් දෙකක (අක්. 09, රූ. 03, පර්. 32) ක් විශාල ඉඩම හා එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් මඩමේගොඩ පාරේ වරිපනම් අංක 31, 3/31 දරන දේපළ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(ඌව කලාපය),

මහජන බැංකුව,
ඌව කලාප කාර්යාලය,
බදුල්ල.

12-172

---

### කඳුරට සංවර්ධන බැංකුව

### 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.02 දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මාතලේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඕ. ඩබ්. ජයම්පති රත්නදිවාකර මහතා විසින් ලියා සහතික කරන ලද 1999.08.16 දිනැති අංක 1584 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම ගලේවෙල, දඹුයාය අංක 265 F යන ලිපිනයෙහි පදිංචි සුහසිංහ ආරච්චිලාගේ රෝහණ සුසන්ත යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2008.07.31 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් එක්ලක්ෂ හැටහයදස් හාරසිය අසූ අටයි ශත පනස් දෙක (රු. 1,66,488.52) ක් වූ මුදල හා එදින සිට රුපියල් අසූනම දාහක් (රු. 89,000) සඳහා වාර්ෂිකව 27% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 1584 මගින් උකස් කරනු ලැබුවාවූ ද, මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල කෝරලේ දඹුයාය නමැති ගමේ පිහිටි දඹුයාය නමැති ප්‍රමාණයෙන් රූඩ් එකක් විශාල උතුරට : පී. එච්. පී. ප්‍රේමතිලකගේ ඉඩම ද, නැගෙනහිරට : පී. පී. අබේරත්නගේ ඉඩම ද, දකුණට : පී. බී. මල්ලිකාගේ ඉඩම ද, බස්නාහිරට : පී. බී. මල්ලිකාගේ ඉඩමද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු ලියනගේ සිරිපාල මහතා විසින් 1997.12.24 දින මැන සාදන ලද අංක 31 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 01 දරන කොටසට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : පී. එච්. පී. අනුරට අයත් ඉඩම ද, නැගෙනහිරට : අබේරත්නට අයිති ඉඩම ද, දකුණට : පී. එච්. පී. ජයසේනට අයිති ඉඩම සහ ගලේවෙල නගරයට ප්‍රවිෂ්ඨ වීම සඳහා වෙන්කර ඇති පාර ද, බස්නාහිරට : පී. එච්. පී. ජයසේනට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් 33 (අක්. 00, රූඩ් 00, පර්. 33) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ එල්. ඩී. ඕ/ඩී 106/55 යටතේ 1999.08.16 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධාන වලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
අංක 130, කටුගස්තොට පාර,
ප්‍රධාන කාර්යාලය,
මහනුවර.

12-152/5

## කඳුරට සංවර්ධන බැංකුව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.02 දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් මාතලේ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඕ. ඩබ්. ජයම්පති රත්නදිවාකර මහතා විසින් ලියා සහතික කරන ලද 2007.07.16 දිනැති අංක 7772 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම තලකිරියාගම, පහලවැව, මහකඩේ බාරේ යන ලිපිනයෙහි පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ සංජීව වසන්ත තෙන්නකෝන් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් 2008.07.31 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් පන්ලක්ෂ අනූ එක්දහස් හයසිය හැත්තෑ එකයි ශත විසි තුන (රු. 5,91,671.23) ක් වූ මුදල හා එදින සිට රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) සඳහා වාර්ෂිකව 28% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතුව හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 7772 මඟින් උකස් කරනු ලැබුවාවූ ද, මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු කොට්ඨාසයේ කන්දපල්ල කෝරළේ පහලවැව පිහිටි කැටකැලගහ තනිකොටුව නමැති නැගෙනහිරට : ඒ. පී. බණ්ඩාට අයති ඉඩමේ වැටද, දකුණට : ඒ. පී. උක්කුවා හේනයාට අයිති ඉඩමේ වැට ද, බස්නාහිරට : ඩී. එම්. කිරිබණ්ඩාට සහ තවකෙනෙකුට අයිති ඉඩමේ වැට ද, උතුරට : ඒ. පී. කිරිබණ්ඩාට අයිති ඉඩමේ වැටද මායිම් වූ රූඩ් තුනක් (අක්. 00, රූඩ්. 03, පර්. 00) පමණ විශාල ඉඩමට මාතලේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක මහතා විසින් 2001.10.24 දින මැන සාදන ලද අංක 5486 දරන පිඹුරේ කැබලි අංක 01 දරන කොටසට එකී පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට: ඒ. පී. කිරිබණ්ඩා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ඒ. පී. බණ්ඩා හිමිකම් කියන ඉඩම ද, දකුණට : ඒ. පී. උක්කුවා හේනයාට අයිති ඉඩම ද, බස්නාහිරට : සීලවතී සහ ටී. එම්. අශෝක තෙන්නකෝන් හිමිකම් කියන ඉඩම සහ පාරද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් පහයි දශම එකයි පහක් (අක්. 00, රූඩ්. 02, පර්. 5.15) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඩී. 176/190 යටතේ 2007.07.17 දින ලියාපදිංචි කර ඇත. යථොක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, ප්‍රචාරය හා විකිණීම සඳහා දරන්නට සිදුවන වියදම්ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධානවලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 130, කටුගස්තොට පාර,
මහනුවර.

12-152/4

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ජූලි මස 30 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන අංක 427 සහ 2006 ජනවාරි මස 30 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය තලවතුගොඩ, ශාන්තිපුර, 4 වන පටුමගේ අංක 269බී දරන ස්ථානයේ පදිංචි මෙහි මින්මතු උකස්කරු වශයෙන් සඳහන් කරනු ලබන රුක්මල් සුසන්ත ඩයස් යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී බැඳුම්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.07.09 වන දිනට රුපියල් විසිහයලක්ෂ පනස්තුන්දහස් හතළිස් එකකුත් ශත හයක මුදලක් (රු. 26,53,041.06) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් විසිහයලක්ෂ පනස්තුන්දහස් හතළිස් එකකුත් ශත හයක මුදල (රුපියල් 26,53,041.06) සහ 2008.07.09 දිනට නිවාස ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් විසිතුන්ලක්ෂ අසූනවදහස් හාරසිය අනූපහකුත් ශත හැත්තෑඑකක මුදල (රු. 23,89,495.71) මත 2008.07.10 වන දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 26% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයෙන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වේතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමඩලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 සහ 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 4 දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 9 ද (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : එකී අංක 5643 දරන පිඹුරේ ලොට් බී

ද, බස්නාහිරට : ලොට් 5 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) හෙවත් හෙක්ටයාර බින්දුවකුත් දශම බින්දුවයි දෙකයි හතයි අටක (හෙක්ටයාර 0.0278) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියලු දේත් සමග.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමදලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 සහ 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 5 දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 9 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : එකී අංක 5643 දරන පිඹුරේ ලොට් බී ද, බස්නාහිරට : එකී අංක 5642 දරන පිඹුරේ ලොට් 2 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහක (අ. 0, රූ. 0, පර්. 11) හෙවත් හෙක්ටයාර් බින්දුවකුත් දශම බින්දුවයි දෙකයි හතයි අටක (හෙක්ටයාර 0.0278) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියළු දේත් සමගය.

තව ද, ඉහත කී බිම් කොටස්වලට ප්‍රවිෂ්ඨවීම සඳහා පහත සඳහන් ඉඩම්වලින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වේ :

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමදලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 සහ 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 9 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම්) දරන බිම් කොටසට මායිම්,

උතුරට : ලොට් 11, ලොට් 13 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම), ලොට් 17, ලොට් 18 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම), ලොට් 20 සහ 21 ද, නැගෙනහිරට : ලොට් 28 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, දකුණට : ලොට් 3, 4, 5, 6, 7 සහ 8 ද, බස්නාහිරට : ලොට් 10 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහනවයකුත් දශම හතයි හතක (අ. 0, රූ. 0, පර්. 19.77) හෙවත් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි පහයි බින්දුවයි බින්දුවක (හෙක්ටයාර 0.0500) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියලු දේත් සමගය.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමදලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 සහ 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 13 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 14 ද, නැගෙනහිරට : ලොට් 15, 16 සහ 17 ද, දකුණට : ලොට් 9 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, බස්නාහිරට : ලොට් 11 සහ 12 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම නවයයි අටක (අ. 0, රූ. 0, පර්. 4.98) හෙවත් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි එකයි දෙකයි හයක (හෙක්ටයාර 0.0126) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියළු දේත් සමග ය.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමදලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 සහ 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 18 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 15 ද, නැගෙනහිරට : ලොට් 19 සහ 20 ද, දකුණට : ලොට් 9 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, බස්නාහිරට : ලොට් 17 සහ 16 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හතරයි දශම අටයි හතක (අ. 0, රූ. 0, පර්. 4.87) හෙවත් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි එකයි දෙකයි තුනක (හෙක්ටයාර 0.0123) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියලු දේත් සමගය.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමදලගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 සහ 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 27 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 24 ද, නැගෙනහිරට : ලොට් 25 සහ 26 ද, දකුණට : ලොට් 28 (අඩි 30ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, බස්නාහිරට : ලොට් 21, 22 සහ 23 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම හයයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 5.60) හෙවත් හෙක්ටයාර බින්දුවයි දශම බින්දුවයි එකයි හතරයි දෙකක (හෙක්ටයාර 0.0142) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියලු දේත් සමගය.

5. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ උතුරු හෝකන්දර පිහිටි ලුනුමදලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් මැන සාදන ලද අංක 5658 හා 2005 අගෝස්තු මස 23 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 28 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 27 (අඩි 15ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් 26 ද, නැගෙනහිරට: වසන්තිට අයිති ඉඩම සහ ජේ. විජේසුන්දර සහ තවත් අයට අයිති කලුහෙට්ටිගේවත්ත ද, දකුණට : පාර ද, බස්නාහිරට : එකී අංක 5643 දරන පිඹුරේ ලොට් බී, සහ ලොට් 1, 2 සහ 9 (අඩි 20ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම හතයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 1.70) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි බින්දුවයි පහයි හයක (හෙක්ටයාර 0.1056) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් සෑම සියළු දේත් සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

12-204/2

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (පී. කිව්. 116)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතිය

ගිණුම් අංකය : 1280004531.
ණය ගිණුම් අංකය : 211010.

2008 අප්‍රේල් මස 04 වන දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. සී. විජේනාරායන විසින් සහතික කරන ලද්දාවූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2004 සැප්තැම්බර් මස 20 වන දින හා අංක 878 දරන

බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේවන්ත වෙල්ලාලගේ ලලිත් ඉන්දික ණයකරු හැටියට ද, පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස් එක් දහස් හයසිය තිස් එකයි ශත අසූවක (රු. 2,51,631.80) මුදලක් 2008 ජනවාරි මස 31 වන දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙලක්ෂ පනස් එක් දහස් හයසිය තිස් එකයි ශත අසූවක (රු. 2,51,631.80) මුදලට 2008 පෙබරවාරි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 173,550ක මුදල මත 20% ක වැඩිපුර වාර්ෂික පොලි ප්‍රමාණයක් ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්. අඩුකොට එකී අංක 878 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

(1) බලයලත් මානක ඒ. වීරසිංහ මහතා විසින් 2004.04.25 වන දින සාදන ලද අංක 1096 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තු දොරපේ පිහිටි රුක්මල්පෙගෙවත්ත ඉඩමේ ලොට් 6 සහ 7 දරන කොටස් වලින් යුත් යාබද සහ ඒකාබද්ද ලොට් 'ඒ ' වශයෙන් ලකුණුකොට වෙන් කරන ලද භූමිය ගසකොළ, වගාවන් සහ ගොඩනැගිලි සමග වූ ඉඩමට මායිම්, උතුරට : රන්ගොඩ කන්ද ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 9, 8 සහ 42 ද, දකුණට : එම ඉඩමේ ලොට් 42 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 42 (ප්‍රවිශ්ඨ මාර්ගය) ද, එම ඉඩමේ ලොට් 5 සහ 4 ද යන මායිම් තුළ රූඩ් එකයි, පර්චස් අටයි දශම පහයි බින්දුව (අ. 0, රූ. 1. පර්. 8.50) ක් හෝ හෙක්ටෙයාර් 0.1227 ක් විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 888/69 වෙළුමේ පත්ඉරුව යටතේ ලියාපදිංචිව ඇත.

එකී ලොට් 'ඒ ' පහත සඳහන් කොටස් හා ඒකාබද්ධව ඇත.

(2) එකී දොරපේ පිහිටි රුක්මල්පෙගෙවත්ත ඉඩමේ බලයලත් මානක එස්. ඒ. බිබී විසින් 1954.01.16 වන දින සාදන ලද අංක 523පී දරන පිඹුරේ ගාල්ල දිසා අධිකරණයේ අංක එල්/1755 දරන නඩුවේ වාර්තාගත වී ඇති බෙදා වෙන් කරන ලද ලොට් 6 දරන කොටසට මායිම්, උතුරටः රන්ගොඩකන්ද ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 7 ද, දකුණට : එම ඉඩමේ ලොට් 42 (ප්‍රවිශ්ඨ මාර්ගය) ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 4 සහ 5 ද යන මායිම් තුළ පර්චස් තිස් නවයයි දශම පහයි බිංදුව (අ. 0, රූ.0, පර්. 39.50) ක් විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 546/166 යටතේ ලියාපදිංචි වී ඇත.

එකී දොරපේ පිහිටි රුක්මල්පෙගෙවත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 7 දරන කොටසට මායිම්, උතුරට : රන්ගොඩකන්ද ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 8 සහ 9 ද, දකුණට : එම ඉඩමේ ලොට් 42 (ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 6 ද යන මායිම් තුල පර්චස් නවයයි දශම බිංදුවයි නවයක් (අ.0, රූ.0 පර්. 9.09) ක් විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 643/49 යටතේ අංක පී/523 දරන පිඹුරේ පෙන්වා ඇති පරිදි ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම/ලේකම්.

12-207

### කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතිය

ණය අංකය : 1820005464.
ණය ගිණුම් අංකය : 250120.

2008 ජුනි මස 04 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී :

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. අබයවර්ධන විසින් 2005 ජූලි මස 12 වන දින සහතික කරන ලද අංක 2993 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් නමින් වූ දැනට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූද, බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ශන්මුගනාතන් සෙල්වනාතන් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක් මිලියන හාරසිය හැට අටයි ශත තිස් පහක (රු. 1,000,468.35) මුදලක් 2008 මාර්තු මස 30 වන දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක් මිලියන හාරසිය හැට අටයි ශත තිස් පහක (රු. 1,000,468.35) මුදලට 2008 මාර්තු මස 31 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 8,97,025.80 මුදල මත 15% ක වැඩිපුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 2993 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බලයලත් මානක ඒ. ටී. පී. පෙරේරා විසින් 2002 නොවැම්බර් මස 14 වන දින සාදන ලද අංක 903 දරන පිඹුර පරිදි සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ හෙළඋඩ පත්තු මැද කෝරළේ, කිරිමැටිතැන්න ග්‍රාමයේ පිහිටි ලංකාබරණ වත්තේ කොටසක් ලෙස හැඳින්වෙන බෙදා වෙන්කරන ලද ලොට් 20 දරන ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 19 සහ 6 ද, නැගෙනහිරට : ලොට් 6 සහ 21 ද, දකුණට : ලොට් 21 සහ 18 ද, සහ බස්නාහිරට : ලොට් 19 ද යන මායිම් තුල පර්චස් විස්සක් (අ.0, රූ.0 පර්. 20) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සියළුදේත් සමග වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 316/151 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම් ලේකම්.

12-208

## කඳුරට සංවර්ධන බැංකුව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43(ආ) වගන්තිය හා 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානිත ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.08 දින සම්මත කරන ලද යෝජනාව

කඳුරට සංවර්ධන බැංකුව වෙනුවෙන් නුවරඑළිය නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ටී. කරුණාතිලක මහතා විසින් ලියා සහතික කරන ලද 1997.03.27 දිනැති අංක 16315 දරන උකස්කරය ප්‍රකාර බැංකුවට අයවිය යුතුව ඇති මුදල් ගෙවීම් මන්දාරම් නුවර, මල්සරා නුවර, අංක 393 යන ලිපිනයෙහි පදිංචි දරාඩ පිඹුරේ දිසානායක මුදියන්සේලාගේ හපුහින්න රාජනායක යන අය විසින් පැහැර හැර ඇති හෙයින්, 2008.07.31 දිනට යථෝක්ත උකස්කරය යටතේ බැංකුවට අයවිය යුතුව ඇති රුපියල් දෙලක්ෂ හැත්තෑ අටදාස් එකසිය හැට හතරයි ශත හතලිස් හත (රු. 2,78,164.47) ක් වූ මුදල හා එදින සිට රුපියල් හැත්තෑ දාස් අටසියය (රු. 70,800) සඳහා වාර්ෂිකව 28% බැගින් විකිණීමේ දිනය දක්වා පොළිය අයවිය යුතු හා ණයව ඇති හෙයින් පූර්වෝක්ත බැංකුවට පූර්වෝක්ත උකස්කර අංක 16315 මගින් උකස් කරනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති තුමියගේ අත්සනින් යුතුව මෙහි ණයකාර මාගේ පියාණන් වූ දරාඩ කුඹුරේ දිසානායක මුදියන්සේලාගේ රම්බණ්ඩාට ජයභූමි ඔප්පුවක් පිට ලැබී ඔහුගෙන් පසු ඔහුගේ පුත්‍රයා වන දරාඩ කුඹුරේ දිසානායක මුදියන්සේලාගේ හපුහින්න රාජනායක වන මට පසු උරුමයට අයිතිවන මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට උඩගම්පහ කෝරළේ මන්දාරම් නුවර, මල්සරා නුවර පිහිට මන්දාරම් නුවර වත්ත නමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් සකස් කරන ලද නුවරඑළිය මිනුම් අධිකාරි භාරයේ ඇති පී. පී. නු. 153 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 642 දරන බිම් කට්ටිය වන උතුරට : කඳුකරේ රක්ෂිත බිම් තීරය ද, නැගෙනහිරට : එකී පිඹුරේ සඳහන් අංක 643 දරන බිම් කට්ටිය ද, දකුණට : පාරක් සඳහා වෙන්කළ බිම් තීරුව ද, බස්නාහිරට : කඳුරේ රක්ෂිත බිම් තීරුව ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි, පර්චස් විසිහයක් (අක්. 0, රූඩ්. 03, පර්. 26) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියළු දේත් ද වේ.

මෙම උකස නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ උහේ/9/1716/96 යටතේ 1997.04.07 දින ලියාපදිංචි කර ඇත.

යථෝක්ත මුදල හෝ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද ප්‍රචාරය සහ විකිණීමේ සඳහා දරන්නට සිදුවන වියදම් ද, තීරණයේ දිනට පසුව කරන ලද ගෙවීම් අඩුකර අයකර ගැනීම පිණිස යථෝක්ත පනතේ විධිවිධාන වලට අනුව බැංකුවේ ලියාපදිංචි වෙන්දේසිකරු වන ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට කඳුරට සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී.

කඳුරට සංවර්ධන බැංකුව,
අංක 130, කටුගස්තොට පාර,
ප්‍රධාන කාර්යාලය,
මහනුවර.

12-152/2

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අගෝස්තු මස 28 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජේපාල දීගොඩ ගමගේ විසින් ලියා සහතික කරන ලද මෙහි මින්මතු 'බැඳුම්කරය' වශයෙන් හඳුන්වනු ලබන අංක 5298 සහ 2006 දෙසැම්බර් මස 15 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි මින්මතු උකස්කරු වශයෙන් සඳහන් කරනු ලබන අතුරුගිරිය සමනල මාවතේ අංක 1/41A දරන ස්ථානයේ පදිංචි හේනාදීරගේ දොන් අජිත් ගුණසේකර යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරුවන් විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.04.07 වන දිනට රුපියල් හත්ලක්ෂ අසූපන්දහස් දෙසිය අසූ දෙකකුත් ශත තිස්හතරක මුදලක් (රු. 7,85,282.34) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් හත්ලක්ෂ අසූපන්දහස් දෙසිය අසූදෙකකුත් ශත තිස් හතරක මුදල (රුපියල් 785,282.34) සහ 2008.04.07 දිනට නිවාස ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් හත්ලක්ෂ හතළිස්හයදහස් අසූවකුත් ශත දහයක මුදල (රුපියල් 746,080.10) මත 2008.04.08 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20.75% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රයඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ අතුරුගිරිය උප කාර්යාලයේ සහ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ අතුරුගිරිය ගමේ සමනල මාවතේ පිහිටි වනපොතුමුකලාන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් මැන සාදන ලද අංක 2937 සහ 2004 පෙබරවාරි මස 21 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්

කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම් : උතුරට : වනපොතුමුකලාන, අංක 11607 දරන පිඹුරේ ලොට් B2 ද, නැගෙනහිරට සමනල මාවත ද, දකුණට : එම ඉඩමේම කොටසක් ද, බස්නාහිරට : බොරළුගොඩගේ දේවප්‍රිය චන්ද්‍රවංශගේ වනපොතුමුකලාන ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2937 දරන පිඹුර අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේත් සමගය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G429/114 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යුනියන් පෙදෙස,
කොළඹ 02.

12-204/5

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 ) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වන වගන්තිය ප්‍රකාර (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අගෝස්තු මස 28 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. පූර්ණි ප්‍රහර්ෂිණී නිල්මී මහීපාල විසින් සහතික කරන ලද මෙහි මින් මතු 'බැඳුම්කරය' වශයෙන් හඳුන්වනු ලබන අංක 51 සහ 2005 දෙසැම්බර් මස 29 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනවල සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි මින්මතු උකස්කරු වශයෙන් සඳහන් කරනු ලබන කොළඹ 06 කිරුලපන බලපොකුණ පාරේ අංක 41 දරන ස්ථානයේ පදිංචි උමරු ලෙබ්බේ ජස්වර් යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2007.11.14 වන දිනට රුපියල් දහනවලක්ෂ තුන්දහස් දෙසිය තිස්අටකුත් ශත හැත්තෑහතරක මුදලක් (රුපියල් 19,03,238.74) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද, ඉහත කී රුපියල් දහනවලක්ෂ තුන්දහස් දෙසිය තිස්අටකුත් ශත හැත්තෑහතරක මුදල (රුපියල් 19,03,238.74) සහ 2007.11.14 දිනට නිවාස ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් දහසය ලක්ෂ හැටදෙදහස් හත්සිය විසිතුනකුත් ශත පනස් නවයක මුදල (රුපියල් 1,662,723.59) මත 2007.11.15 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27.50% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය තිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා විසින් මැන සාදන ලද අංක 2630 සහ 2004.01.11 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 2 දරන බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ද, දකුණට : පාර ද, බස්නාහිරට : පාර ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2630 දරන පිඹුර අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ පලතුරු ආදී සෑම සියළු දේත් සමගය.

අංක 2630 දරන පිඹුරේ නිරූපිත ඉහත කී ලොට් 2 දරන බිම් කොටස බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද අංක 1600 සහ 1982.01.10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් A හි උපබෙදීමක් වන අතර එකී ලොට් A පහත සවිස්තරාත්මකව දැක්වේ. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද අංක 1600 සහ 1982.01.10 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ, ලොට් A දරන බිම් කොටසට මායිම් උතුරට : අංක 94 දරන පිඹුරේ ලොට් 3 C (අඩි 8 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද නැගෙනහිරට : පී. විල්බට් ප්‍රනාන්දු සහ තවත් අයට අයිති ඉඩම ද දකුණට : පී. එන්. ප්‍රනාන්දුගේ ඉඩම ද බස්නාහිරට : අඩි 12 පළල පාර සඳහා වෙන් කිරීම (අංක 94 දරන පිඹුරේ ලොට් 3 D ) ද. යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1600 දරන පිඹුර අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමගය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක G1540/212 යටතේ ලියාපදිංචි කර ඇත.

2 වැනි උපලේඛනය

ඉහත කී බිම් කොටසට පහත විස්තර කරන පාර සඳහා වෙන්කිරීම් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතිවාසිකම් ද සමග වේ.

1. ඉහත කී දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද අංක 94 සහ 1977 ජනවාරි මස 30 සහ මාර්තු මස 8 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3C (පාර සඳහා වෙන්කිරීම්) දරන බිම් කොටසට මායිම් උතුරට : ලොට් 3A ද, නැගෙනහිරට : ලොට් 3B සහ පී. පී. ප්‍රනාන්දු සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : ලොට් 3D ද, බස්නාහිරට : පී. එම්. ප්‍රනාන්දුගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 94 දරන පිඹුර අනුව පර්චස් දෙකයි දශම තුනයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 2.30) විශාල බිම් කැබැල්ලය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කීමේ කාර්යාලයේ G1540/30 යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද අංක 94 සහ 1977 ජනවාරි මස 30 සහ මාර්තු මස 08 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3D දරන බිම් කොටසට මායිම් උතුරට පී. එන්. ප්‍රනාන්දුගේ ඉඩම සහ ලොට් 3C ද, නැගෙනහිරට ලොට් 3D සහ පී. පී. ප්‍රනාන්දු, පී. එන්. ප්‍රනාන්දු සහ තවත් අයට අයිති ඉඩමද, දකුණට නන්දනී ඩයස්ගේ ඉඩම ද, බස්නාහිරට පී. එන්. ප්‍රනාන්දුගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 94 දරන පිඹුර අනුව පර්චස් පහක (අ.0, රූ. 0, පර්. 5) විශාල බිම් කැබැල්ලය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1540/31 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

12-204/4

---

## නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අගෝස්තු මස 28 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. පූර්ණි ප්‍රභර්ෂිණී නිල්මි මහීපාල විසින් ලියා සහතික කරන ලද මෙහි මින්මතු "බැඳුම්කර" වශයෙන් හඳුන්වනු ලබන අංක 48 සහ 2005 දෙසැම්බර් මස 29 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 149 සහ 2006 මැයි මස 18 වන දින දරන දෙවැනි උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි මින්මතු උකස්කරු වශයෙන් සඳහන් කරනු ලබන කොළඹ 06 කිරුලපන බලපොකුණ පාරේ අංක 41 දරන ස්ථානයේ පදිංචි උමරු ලෙබ්බේ ජස්වර් යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2007.11.14 වන දිනට නිවාස ණය දෙක මත නොගෙවූ රුපියල් පනස්හත්ලක්ෂ හැත්තෑහතරදහස් හාරසිය තිස්එකකුත් ශත තිහක මුදලක් (රුපියල් 57,74,431.30) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද, ඉහත කී රුපියල් පනස්හත්ලක්ෂ හැත්තෑහතරදහස් හාරසිය තිස්එකකුත් ශත තිහක මුදල (රුපියල් 57,74,431.30) සහ 2007.11.14 දිනට පළමු නිවාස ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් දහසයලක්ෂ හැටදෙදහස් හත්සිය එකකුත් ශත පනස්හයක මුදල (රුපියල් 16,62,701.56) මත 2007.11.15 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27.50% බැගින් තවදුරටත් පොලිය ද එමෙන්ම 2007.07.14 දිනට දෙවන නිවාස ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් තිස්පන්ලක්ෂ පනස්දහසක මුදල (රුපියල් 35,50,000) මත 2007.11.15 වන දින සිට විකිණීමේ දින තෙක් වර්ෂයකට 19.88% බැගින් තවදුරටත් පොලිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වේනොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඕක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලයේ පල්ලේ පත්තුවේ, දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා විසින් මැන සාදන ලද අංක 2630 සහ 2004.01.11 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 1 දරන බිම් කොටසට මායිම්, උතුරට : පාර ද, නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ද, දකුණට: ලොට් 2 ද, බස්නාහිරට : පාර ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2630 දරන පිඹුර අනුව පර්චස් දහයක (අ.0, රූ. 0, පර්. 10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමගය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1540/220 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත බිම් කොටසට පහත විස්තර කරන පාර සඳහා වෙන් කිරීම් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතිවාසිකම් ද සමග වේ.

(1) ඉහත කී දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද අංක 94 සහ 1977 ජනවාරි මස 30 වන දින සහ මාර්තු මස 8 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3C (පාර සඳහා වෙන් කිරීම) දරන බිම් කොටසට මායිම් උතුරට : ලොට් 3 Aද, නැගෙනහිරට : ලොට් 3B සහ පී. පී. ප්‍රනාන්දු සහ තවත් අයගේ ඉඩම ද, දකුණට : ලොට් 3D ද, බස්නාහිරට පී. එම්. ප්‍රනාන්දුගේ ඉඩම ද යන මායිම්, තුළ පිහිටි ඉහත කී අංක 94 දරන පිඹුර අනුව පර්චස් දෙකයි දශම තුනයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 2.30) විශාල බිම් කැබැල්ල ය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1540/30 යටතේ ලියාපදිංචි කර ඇත.

(2). ඉහත කී දකුණු තලංගම පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩබ්ලිව්. මාකලන්ද විසින් මැන සාදන ලද අංක 84 සහ 1977 ජනවාරි මස 30 වන දින සහ මාර්තු මස 8 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3D දරන බිම් කොටසට මායිම් උතුරට : පී. එන්. ප්‍රනාන්දුගේ ඉඩම සහ ලොට් 3C ද, නැගෙනහිරට : ලොට් 3D සහ පී. පී. ප්‍රනාන්දු, පී. එන්. ප්‍රනාන්දු සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : නන්දනී ඩයස්ගේ ඉඩම ද, බස්නාහිරට : පී. එන්. ප්‍රනාන්දුගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 94 දරන පිඹුර අනුව පර්චස් පහක (අ. 0, රූ. 0, පර්. 5) විශාල බිම් කැබැල්ල ය. මෙය

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1540/31 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

12-204/3

---

## මහජන බැංකුව - ලුණුගල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව වෙනුවෙන් ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් සහතික කරන ලද අංක 4637 සහ 2006.09.01 වන දින දරන උකස් බැඳුම්කරය සහ අංක 5151 සහ අංක 5152 යන 2007.05.03 දින දරන උකස් බැඳුම්කර දෙක යන බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම වර්ණකුලසූරිය දෙහිවලගේ බෙන්සි දේවිකා ප්‍රියදර්ශනී කොස්තා සහ වර්ණකුලසූරිය ගාමිණී ගුණවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර අංක 4637 මත රුපියල් දහසය ලක්ෂ හැට හතරදාස් එකසිය හතලිස් පහයි ශත පනස් පහක (රු. 16,64,145.55) මුදලක් සහ එකී අංක 5151 දරන බැඳුම්කරය මත රුපියල් දහනව ලක්ෂ විසි නවදාස් අනූහතයි ශත දහසයක (රු.19,29,097.16) මුදලක් සහ එකී අංක 5152 දරන බැඳුම්කරය මත රුපියල් හැත්තෑ පන්ලක්ෂ පනස් නවදාස් නවසිය තිස් පහයි ශත අසූහතක (රු.75,59,935.87) මුදලක් යන මුදල් ප්‍රමාණයන් දැනට එකී මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් එකී රුපියල් දහසය ලකෂ හැට හතරදාස් එකසිය හතලිස් පහයි ශත පනස් පහක (රු. 16,64,145.55) මුදලක් සහ ඒ සමග එකී රුපියල් දහසය ලක්ෂ හැට හතරදාස් එකසිය හතලිස් පහයි ශත පනස් පහක (රු.1,16,64,145.55) මුදල මත 2007.11.30 වන දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් තවදුරටත් වූ පොලිය ද ඒ සමග රුපියල් දහනව ලක්ෂ විසි නවදාස් අනූහතයි ශත දහසයක (රු. 19,29,097.16) මුදලක් සහ ඒ සමග එකී රුපියල් දහනව ලක්ෂ විසි නවදාස් අනූහතයි ශත දහසයක (රු.19,29,097.16) මුදල මත 2007.11.30 වන දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් තවදුරටත් වූ පොලිය ද ඒ සමග රුපියල් හැත්තෑ පන්ලක්ෂ පනස් නවදහස් නවසිය තිස් පහයි ශත අසූහතක (රු. 75,59,935.87) මුදලක් සහ ඒ සමග එකී රුපියල් හැත්තෑ පන්ලක්ෂ පනස් නවදහස් නවසිය තිස් පහයි ශත අසූහතක (රු. 75,59,935.87) මුදල මත 2007.11.30 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිතුන (23%) බැගින් තවදුරටත් වූ පොලියද සමග එකී මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු එකී මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා බදුල්ල බලය ලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක යන අය විසින් එකී අංක 4637, අංක 5151 සහ අංක 5152 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තරය

01. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැගම් කෝරළේ උඩුගහපත්තුවේ බිබිල ප්‍රාදේශීය සභා සීමාව තුළ බිබිල ග්‍රාමයේ පිහිටි "හන්ගරම අරාවේවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට අවසරලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර සෑදූ 2006.02.15 දිනැති අංක 4747/A දරන පිඹුරේ ඉඩම් කැබලි අංක 01 වශයෙන් සලකුණු කොට බෙදා වෙන් කොට නිර්ණය කර ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : අංක 4747 පිඹුරේ කැබලි අංක 2, නැගෙනහිරට : අංක 4747 පිඹුරේ කැබලි අංක 01, දකුණට : සරත් ප්‍රේමලාල් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : මහා මාර්ග රක්ෂිතය යන මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම පහක (අක්. 0, රූ. 0, පර්. 2.5) වපසරියෙන් යුතු ඉඩම් කොටස, ගොඩනැගිලි, වැවිලි ඇතුළු එහි පිහිටි සෑම සියළු දේත් සමග වේ.

එකී අංක 729 දරන පිඹුරේ කැබලි 1 වශයෙන් නැවතත් මැන සාදා ඇති පිඹුරු අංක 4747A පිඹුරේ එකී කැබලි අංක 1 වඩාත් පූර්ණ වශයෙන් පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

පෙර කී බිබිලේ ග්‍රාමයේ පිහිටි, හන්ගරම අරාවේවත්ත නමැති ඉඩමට අවසරලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර සෑදූ 1996.09.09 දිනැති අංක 729 දරන පිඹුරේ ඉඩම් කැබලි අංක 1 වශයෙන් සලකුණු කොට බෙදා වෙන් කොට නිර්ණය කර ඇති ඉඩම් කොටස වූ එකී කැබලි අංක 1 හි මායිම් උතුරට : මෙම ඉඩමේම කොටසක්, නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස, බස්නාහිරට : පාර රක්ෂිතය යන මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම පහක (අක්. 0, රූ. 0, පර්. 2.5) වපසරියෙන් යුතු ඉඩම් කොටස, ගොඩනැගිලි, වැවිලි ඇතුළු එහි පිහිටි සෑම සියළු දේත් සමග වේ. මෙය මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K79/264 යටතේ ලියාපදිංචි කර ඇත.

02. පෙර කී බිබිල ග්‍රාමයේ පිහිටි "හන්ගරම අරාවේවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට අවසරලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක සෑදූ 2003.06.29 දිනැති අංක 1253 දරන පිඹුරේ ඉඩම් කැබලි අංක 1 වශයෙන් සලකුණු කොට බෙදා වෙන් කොට නිර්ණය කර ඇති ඉඩම් කොටස වූ එකී ඉඩම් කැබලි 1 ට මායිම් උතුරට : ආර්. සරත් කුමාර සහ එම්. ස්වාමිනාදන්ගේ ඉඩම, නැගෙනහිරට : ඩබ්. එම්. ස්වර්ණපාලගේ ඉඩම, දකුණට : සරත් ප්‍රේමලාල් සහ ජීවන්ත ගමගේ අයිතිවාසිකම් කියන හන්ගරම අරාවේ ඉඩම් කොටස, බස්නාහිරට : පාර සහ හන්ගරම අරාවේවත්තේ ඉඩම් කොටස යන මායිම් තුළ පිහිටි අංක M1253 පිඹුරට අනුව පර්චස් දහතුනක් (අක්. 0, රූ. 0, පර්. 13.0) වඩාත් නිවැරදිව පර්චස් දාහතරක (අක්. 0, රූඩ්. 0, පර්. 14.0) වපසරියෙන් යුතු ඉඩම් කොටස, ගොඩනැගිලි, ගස් වැවිලි ඇතුළු

එහි පිහිටි සෑම සියළු දේත් සමග වේ. මෙය මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K79/265 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කලාප සහකාර සාමාන්‍යාධිකාරී,
(ඌව).

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

12-164

---

**මහජන බැංකුව - මහරගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.04.23 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. ඉඳුරුව මහත්මිය විසින් සහතික කරන ලද අංක 2651 සහ 2006.10.13 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම දේවනාරායන ආචාරිගේ ආරියරත්න මහතා සහ දේවනාරායන ආචාරිගේ අනුරුද්ධ දර්ශන මහතා යන දෙදෙනා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 2651 දරන බැඳුම්කරය මත රුපියල් දෙලක්ෂ හැට අට දහස් දෙසිය දහහතරයි සහ අනූ හයක (රු. 2,68,214.96) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දෙලක්ෂ හැට අට දහස් දෙසිය දහහතරයි සත අනූ හයක (රු. 268,214.96) එකී මුදල ද 2008.01.31 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අය කර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 2651 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ පල්ලිගෙදර පිහිටියා වූ ද "තල්ගහවත්ත නැතහොත් පැලැන්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද අංක 1672 හා 1996 මාර්තු 30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 3බී ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : ප්‍රධාන පාර සහ ලොට් 3 ඒ ද, නැගෙනහිරට : ලොට් 3 ඒ සහ ඩී. ඩී. සෝමාවතී හිමිකම් කියන කුඹුර ද, දකුණට : ඩී. ඩී. සෝමාවතී හිමිකම් කියන කුඹුර සහ ලොට් 3සී ද, බස්නාහිරට : ලොට් 3සී සහ ප්‍රධාන පාර ද, මායිම් වන්නා වූ ද එකී අංක 1672 දරන පිඹුරට අනුව පර්චස් එකොළහක් (අක්. 0, රූඩ්. 0, පර්. 11) විශාල වූ ද, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2876/109 හි ලියාපදිංචි කර ඇත්තා වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි කහකොළ, වැවිලි හා වෙනත් සියලු දේ ත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II ).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

12-174

---

**සෙලාන් බැංකුව පී. එල්. සී. - කටුනේරිය ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවූ 9 යටතේ ලියා පදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මතර කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0550-02121413-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. එන්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද 2006.08.01 දිනැති අංක 682 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ඉහළ කොත්තරමුල්ල පදිංචි ජයසිංහ මුදලිගේ සංජීවනී හේෂානි සහ ජයසූරිය ආරච්චිගේ තරිඳු බාෂුරා මධුෂංක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් නවලක්ෂ හැටහයදහස් එකසිය තුනයි ශත පනස් දෙකක (රු. 9,66,103.52) මුදලක්, 2008.03.31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 9,66,103.52 මුදල ද, 2008 අප්‍රේල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 682 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි

පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

වයඹ පලාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරලේ මැද පලාත පාලලුවල්ගල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ජේ. ගෝමස් විසින් සාදන ලද 2001.08.01 දිනැති අංක 4820 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන නාගහවත්ත නමැති ඉඩමේ ලොට් 01 දරන බෙදූ ඉඩම් කොටසට මායිම් උතුරට එකී සැලැස්මේ සඳහන් ලොට් 02 ද, නැගෙනහිරට එකී සැලැස්මේ සඳහන් ලොට් 02 ද, දකුණට කොත්තරමුල්ල සිට නාරාවිලට යන මහා මාර්ගය ද, බස්නාහිරට අයි. එම්. දයාසේනගේ ඉඩම ද යන මායිම් තුළ පර්චස් දහඅටයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 18.9) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය මාරවිල ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ජේ. 110/95හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

12-157

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 අගෝස්තු මස 28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් හෙන්දවිතාරණගේ චන්ද්‍රකුමාර් ද සිල්වා විසින් ලියා සහතික කරන ලද මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන අංක 346 සහ 2005 ජූලි මස 27 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි මින්මතු උකස්කරු වශයෙන් සඳහන් කරනු ලබන කොළඹ 06 ගජබා පෙදෙසේ අංක 8 දරන ස්ථානයේ පදිංචි රන්මල් ගමගේ ගොඩිගමුව යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2007.06.27 වැනි දිනට රුපියල් නවලක්ෂ හැත්තෑනවදහස් එකසිය තිස්තුනකුත් ශත අනූඅටක මුදලක් (රුපියල් 979,133.98) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් නවලක්ෂ හැත්තෑනවදහස් එකසිය තිස්තුනකුත් ශත අනූ අටක මුදල (රුපියල් 979,133.98) සහ 2007.06.27 වැනි දිනට නිවාස ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් නවලක්ෂ තිස්හත්දහස් පන්සිය තිස්තුනකුත් ශත එකක මුදල (රුපියල් 937,533.01) මත 2008.06.28 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19.25% බැගින් තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය සහ මහ නගර සභා සීමාව තුළ නැගෙනහිර පාමංකඩ අංක 45 දරන නාගරික කොට්ඨාසයේ කිරුලපන පිහිටි වර්තමානයේ දී ගජබා පෙදෙසේ වරිපනම් අංක 8 දරන ගොඩපොරගහඕවිට, මරන්ගහවත්ත, බක්මීගහඕවිට, අඹගහවත්ත, ගොරකගහවත්ත, ඊරියගහඕවිට, මීදෙල්ලගහඕවිට, තීඇපෝසිගහඕවිට, කජුගහඕවිට, නුගගහඕවිට, හල්ගහවත්ත, මදන්ගහවත්ත හෙවත් දෙල්ගහකනත්ත, කහටගහඕවිට, බටුගහවත්ත, මිල්ලගහවත්ත, කුරුනුඕවිට, ඉඳිගහඕවිට, කහටගහවත්ත, ගොඩපරගහවත්ත, කජුකැටකෙළගහවත්ත සහ බලපොකුණවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ආර්. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 1072 සහ 1982 ඔක්තෝබර් මස 04 වැනි දින දරන පිඹුරේ නිරූපිත සහ කිරුලපන අංක 4 දරන ලියාපදිංචි පිඹුරේ 11 වන වෙළුමේ 180 වන පත් ඉරුවේ ලියාපදිංචි ලොට් 1583 (අංක 369837, 369838, 369839 සහ 369840 දරන වී. ඕ. ටී. පිඹුරු නිකුත් කරනු ලැබ ඇති අංක 17781 දරන මූලික පිඹුරේහි නැවත බෙදා වෙන් කිරීමක් වන) දරන බිම් කොටසට මායිම් උතුරට : ගජබා පෙදෙස (ලොට් 1550) ද, නැගෙනහිරට : ලොට් 1582 ද, දකුණට : ලොට් 1582 සහ 1619 ද, බස්නාහිරට : ලොට් 1619 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1072 දරන පිඹුර අනුව පර්චස් නවයකුයි දශම එකයි හතක (අ. 0, රූ. 0, පර්. 9.17) හෙවත් හෙක්ටයාර 0.0232ක විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමඟය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේඅයි 162/40 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

12-204/1

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 353628.

2008 මැයි මස 02 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. පී. එස්. කරුණානායක විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2007 මාර්තු මස 16 වැනි දින හා අංක 4007 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ත්‍රී මයින්ඩ් ෆුඩ් ප්‍රොසෙසිංගේ (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහසය මිලියන පන්සිය දොළොස් දහස් විසිඅටයි ශත තිස් පහක (රු. 16,512,028.35) මුදලක් 2008 පෙබරවාරි මස 29 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහසය මිලියන පන්සිය දොළොස් දහස් විසිඅටයි ශත තිස් පහක (රු. 16,512,028.35) මුදල 2008 මාර්තු මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 14,837,750 ක මුදල මත 19% ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 4007 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ෆ්ස්ඩෝෆ් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බලයලත් මානක එන්. එස්. විජේසිංහ විසින් 1970 ජූලි මස 05 වැනි දින සාදන ලද අංක 44 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අතුරුගිරිය ගම්සභා කාර්යාල සීමාව තුළ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුල තලවතුගොඩ පිහිටි ගොඩනැගිලි සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද මිල්ලගහලන්ද සහ ආන්දුරුවනගහකනත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 23 දරන කොටසට මායිම්, උතුරට : ලොට් 24 ද, නැගෙනහිරට : පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 65 ද, දකුණට : ලොට් 22 ද සහ බස්නාහිරට : ඩබ්ලිව් අර්නෝලිස් අප්පුහාමිට අයිති ඉඩම ද, යන මායිම් තුළ අංක 44 දරන පිඹුර පරිදි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී 771/184 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

එකී ලොට් 23 මැතකදී සිදුකරන ලද අංක 2005/354 දරන පිඹුර පරිදි මෙසේ විස්තර කර ඇත.

බලයලත් මානක නලින් හේරත් විසින් 2005 අගෝස්තු මස 17 වැනි දින සාදන ලද අංක 2005/354 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු හේවාගම් කෝරළේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, තලවතුගොඩ පිහිටි ගොඩනැගිලි සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද මිල්ලගහලන්ද සහ ආන්දුරුවනගහකනත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 23ඒ දරන කොටසට මායිම්, උතුරට : (ප්‍රාදේශීය සභා) පාර සහ අංක 44 දරන පිඹුරේ ලොට් 24 ද, නැගෙනහිරට : (ප්‍රාදේශීය සභා) පාර සහ අංක 44 දරන පිඹුරේ ලොට් 22 ද, දකුණට : අංක 44 දරන පිඹුරේ ලොට් 22 සහ ඩබ්ලිව්. අර්නෝලිස් අප්පුහාමිට අයිති ඉඩම ද සහ බස්නාහිරට : ඩබ්ලිව්. අර්නෝලිස් අප්පුහාමිට අයිති ඉඩම සහ අංක 44 දරන පිඹුරේ ලොට් 24 ද යන මායිම් තුළ අංක 2005/354 දරන පිඹුර පරිදි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම.

මෙම ඉඩම ඔස්සේ ගමන් කිරීමේ අයිතිය සහ වෙනත් අයිතීන් ද සමග වේ.

1. එකී තලවතුගොඩ පිහිටි මිල්ලගහලන්ද සහ ආන්දුරුවනගහකනත්ත ඉඩමේ එකී අංක 44 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 20 පළල පාරක් සඳහා වෙන්කර ඇති) බෙදා වෙන් කරන ලද ලොට් 65 දරන කොටසට මායිම් උතුරට : තලවතුගොඩ සිට හෝකන්දරට ඇති පාර සහ 2, 5 සහ ලොට් 41 සිට ලොට් 44 ද, නැගෙනහිරට : ලොට් 6 සිට 15 සහ ලොට් 44 සිට 48, 67, 49, 50 සහ 29 ද, දකුණට ලොට් 29, සිට 33, 66, 34, සහ 16 සිට 19 දක්වා ද සහ බස්නාහිරට : ලොට් 5, 34, 59, 38, 67. 39, 40, 20 සිට 28 සහ ලොට් 1 ද, යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් තිහයි දශම එක (අ. 0, රූ. 3, පර්. 30.1) විශාල ඉඩම අංක 44 දරන පිඹුර පරිදි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී 619/263 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

2. එකී තලවතුගොඩ පිහිටි මිල්ලගහලන්ද මහ ආන්දුරුවනගහකනත්ත ඉඩමේ එකී අංක 44 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 20 පළල පාරක් සඳහා වෙන්කර ඇති) බෙදා වෙන්කරන ලද ලොට් 66 දරන කොටසට මායිම් උතුරට : ලොට් 31 සිට 33, 65 ද, නැගෙනහිරට : ලොට් 34 සිට 38, 56 සහ 54 ද, දකුණට : ලොට් 54, 55. 56 සහ 57 ද සහ බස්නාහිරට : ලොට් 52, 51, 33 සහ 56 සහ 57 ද, යන මායිම් තුළ එකී අංක 44 දරන පිඹුර පරිදි රූඩ් එකයි පර්චස් නවයයි දශම හතරක් (අ.0, රූ. 1, පර්. 9.4) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී 611/283 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

3. එකී තලවතුගොඩ පිහිටි මිල්ලගහලන්ද සහ ආන්දුරුවනගහකනත්ත ඉඩමේ එකී අංක 44 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කර ඇති) බෙදා වෙන් කරන ලද ලොට් 67 කොටසට මායිම් උතුරට : ලොට් 49, 52, 66. 53, 55, 57, 38 ද, නැගෙනහිරට : ලොට් 65 ද, දකුණට : ලොට් 39, 68, 58, 64, 63, 62 සහ 48 ද සහ බස්නාහිරට : ලොට් 65 ද යන මායිම් තුළ එකී පර්චස් තිස් නවයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 39.1) විශාල ඉඩම අංක 44 දරන පිඹුර පරිදි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී 611/282 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

4. එකී තලවතුගොඩ පිහිටි මිල්ලගහලන්ද සහ ආන්දුරුවනගහකනත්ත ඉඩමේ එකී අංක 44 දරන පිඹුරේ පෙන්වා ඇති (අඩි 20 පළල පාරක් සඳහා වෙන්කර ඇති) බෙදා වෙන් කරන ලද ලොට් 68 දරන කොටසට මායිම් උතුරට : ලොට් 67, 63, 64, සහ 59, ද, නැගෙනහිරට : ලොට් 39, 40, 41 සහ 63 ද, දකුණට : ලොට් 42, 60, 61 ද සහ බස්නාහිරට : ලොට් 62, 58, 59 ද, යන මායිම් තුළ එකී පර්චස් තිස් හතරයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 34.8) විශාල ඉඩම එකී අංක 44 දරන පිඹුර පරිදි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඡී 831/02 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

ආර්. ආර්. දුණුවිල,
සමාගම් ලේකම්.

12-210

**මහජන බැංකුව - මිද්දෙණිය ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකුවේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005.10.24 වැනි දින පහත සඳහන් සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මිය විසින් සහතික කරන ලද 2007.06.20 දිනැති අංක 2391 දරන උකස්කරය ප්‍රකාර දර්ශණී ප්‍රියංගිකා වික්‍රමරත්න සහ දොන් අන්ද්‍රයස් වික්‍රමරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද , එකී උකස්කරය යටතේ දැනට රුපියල් ලක්ෂ පහලොවක (රු. 15,00,000) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් 2007.09.14 වැනි දින සිට වර්ෂයකට සියයට විසිඅට (28%) බැගින් රුපියල් ලක්ෂ පහලොවක (රු. 15,00,000) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගතයුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් ලක්ෂ පහළොවක (රු. 15,00,000) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 2391 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1960 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය**

| | | *Make* | *Model* | *Serioal No.* |
|---|---|---|---|---|
| 01. | | Machines - 25 | | |
| | | Yamata | DL 5550 | 20070413209 |
| | | | | 20070413224 |
| | | | | 20070413163 |
| | | | | 20070413192 |
| | | | | 20070311868 |
| | | | | 20070413276 |
| | | | | 20070311831 |
| | | | | 20070413213 |
| | | | | 20070413271 |
| | | | | 20070413245 |
| | | | | 20070413264 |
| | | | | 20070311829 |
| | | | | 20070413150 |
| | | | | 20070413279 |
| | | | | 20070413285 |
| | | | | 20070311866 |
| | | | | 20070413297 |
| | | | | 20070413296 |
| | | | | 20070413267 |
| | | | | 20070413201 |
| | | | | 20070413166 |
| | | | | 20070413193 |
| | | | | 20070413200 |
| | | | | 20070413237 |
| | | | | 20070413212 |
| 02. | | Over Log Meshines - 02 | | |
| | | Jaki | J. R. 2220-6 | 700412024 |
| | | Jaki | J. R. 2220-6 | 700412026 |
| 03. | | Cutting Machines 01<br>CZD - 3 | | |
| 04. | Nos. 27 | DCL 12 H | Clutch Motor | |
| 05. | No. 01 | Silver Star Iron | ES 300 | 002396 |
| 06. | Nos. 01 | STJ 07 Ironing ´Table | | |

| | | *Make* | *Model* | *Serioal No.* |
|---|---|---|---|---|
| 07. | Nos. 27 | Mechine Staste | | |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(දකුණු කලාපය).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලාය,
අංක 7ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට

12-163

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතුයි.
5. සියලුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අගලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වැනි ජේදය | 520 0 | 1,007 0 |
| II වැනි ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වැනි ජේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. ශ. |
|---|---|---|
| (අ) I වැනි කොටස | 31 0 | 5 0 |
| II වැනි කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 0 | 5 0 |
| (ආ) I වැනි ජේදය | 10 0 | 5 0 |
| II වැනි ජේදය | 12 0 | 5 0 |
| III වැනි ජේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| දෙසැම්බර් | 2008.12.05 | සිකුරාදා | 2008.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.12.11 | බ්‍රහස්පතින්දා | 2008.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.12.19 | සිකුරාදා | 2008.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.12.26 | සිකුරාදා | 2008.12.11 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | | | **2009** | | | |
| ජනවාරි | 2009.01.02 | සිකුරාදා | 2008.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.09 | සිකුරාදා | 2008.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.16 | සිකුරාදා | 2009.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.23 | සිකුරාදා | 2009.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.01.30 | සිකුරාදා | 2009.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2009.02.06 | සිකුරාදා | 2009.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.02.13 | සිකුරාදා | 2009.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.02.20 | සිකුරාදා | 2009.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2009.02.27 | සිකුරාදා | 2009.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන"**
රජයේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.